# හරි දැක්ම - 3

## (ජරා-මරණ අවබෝධයෙන් නිවනට)

දන්කන්දේ ධම්මරතන හිමි

(සියලුම හිමිකම් ඇවිරිණි)

## තමන් තමන්ම රවටා ගැනීමක්

ප්‍රායෝගික පදනමක පිහිටා අප විසින් ඉදිරිපත් කර ඇති ධර්ම දේශනා පොත්-පත් ආදිය උපයෝගී කර ගෙන ප්‍රත්‍යක්ෂමය භාවනා අත්දැකීම් තමා විසින් ම ලබා ගන්නේ නම්, ඒවා එලෙසින්ම කොපිකර ඉදිරිපත් කිරීමෙන් ඇතිකර ගනු ලබන 'තමන් තමන්ම රවටා ගැනීමේ මුලාවෙන්' මිදීමට හැකි බව කරුණාවෙන් සළකන්න.

කවර හෝ උපුටා ගැනීමක් දක්වන අවස්ථාවන්හි දී ඒවායේ මූලාශ්‍රයන් දක්වා සදාචාර සම්පන්න වන එක ඉතා අගනේ ය.

# ප්‍රවේශය

('හරි දැක්ම' පළමු පොත්වල පිවිසුම කොටස හා මෙය සම්බන්ධයි. හරි දැක්ම - 2 පොතේ පිවිසුම කොටසේ 'පිරිසිඳ දත යුතු ධර්ම' විස්තරයේ xiv පිටුවේ එක් වාක්‍යයක් අතපසුවීමකින් මුද්‍රණය වී නො මැත. එහි ඝානසම්ඵස්සජා වේදනාවට පසුව පහත දැක්වෙන වාක්‍යය කරුණාකර ඇතුළත් කර ගන්න.
ජිව්හා සම්ඵස්සය නිසා ඇතිවන වේදනාව ජිව්හා සම්ඵස්සජා වේදනාව යි.)

## ප්‍රහාණය කළ යුතු ධර්ම

නිවන් අවබෝධ කර ගැනීමට බලාපොරොත්තු වන අය විසින් ප්‍රහාණය කළ යුතු ධර්ම ගැන අවබෝධයක් ඇතිකර ගෙන, ඒවා ප්‍රහාණය කිරීම සඳහා කටයුතු කළ යුතු ය. '**තං ඛෝ පනිදං දුක්ඛ සමුදයං අරියසච්චං පහාතබ්බං**' දුක්ඛ සමුදයාර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු බව බුදුරජාණන් වහන්සේ විසින් වදාරා තිබේ. දුක්ඛ සත්‍යය පිරිසිඳ දත යුතු ය; මාර්ග සත්‍යය වැඩිය යුතු ය; නිරෝධ සත්‍යය සාක්ෂාත් කළ යුතු ය. (ප්‍රහාණය කළ යුතු දුක්ඛ සමුදය සත්‍යය පිළිබඳ අප විසින් රචිත 'දුක්ඛ සමුදය අතහරින්න'' පොත බැලීම ද ප්‍රයෝජනවත් ය.)

සෝවාන් වීමේ දී සක්කාය දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස කියන සංයෝජන ධර්මයන් ද, අනාගාමී වීමේ දී කාමරාග - පටිඝ සංයෝජන ධර්ම දෙක ද, රහත් වන විට රූප රාග - අරූප රාග - මාන - උද්ධච්ච - අවිජ්ජා යන සංයෝජන ධර්ම පහ ද නිරුද්ධ වේ. ඒ ඒ මාර්ග ඵල ලබන විට ඒ සංයෝජන ධර්ම ක්ෂය වී යන අතර, ඒ හා සමඟම එම සංයෝජනයන් හා සම්බන්ධ වෙනත් ධර්මයන් ද ප්‍රහාණය වේ. මෙසේ ප්‍රහාණය වී යන, ප්‍රහාණය කළ යුතු ධර්ම කොටස් 10 ක් දසුත්තර සූත්‍රයේ දැක් වේ. මෙහි දැක්වෙන්නේ ඒ පිළිබඳව කෙටි විස්තරයකි.

1. 'ඒකෝ ධම්මෝ පහාතබ්බෝ' - එක් ධර්මයක් ප්‍රහාණය කළ යුතු ය. අස්මිමානය ප්‍රහාණය කළ යුතු ඒ එකම ධර්මය යි. 'අස්මී'ති මානං, අස්මිමානං' කියන නිර්වචනයට අනුව අස්මිමානය කියන්නේ 'මම කියා කෙනෙක් සිටී' කියන හැඟීමට යි.

මෙය සක්කාය දිට්ඨිය නො වේ. සක්කාය දිට්ඨිය යනුවෙන් හැඳින්වෙන්නේ පංචස්කන්ධ ධර්ම ආත්මයක් වශයෙන් ග්‍රාහණය කරනා වැරැදි දෘෂ්ටියට යි.

අස්මිමානය නිරුද්ධ කිරීම සඳහා අනිත්‍ය සංඥාව වැඩීම බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. 'අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවේතබ්බා අස්මිමාන සමුග්ඝාතාය. අනිච්ච සඤ්ඤී භික්ඛවේ භික්ඛුනෝ අනත්ත සඤ්ඤා සණ්ඨාති. අනත්ත සඤ්ඤී අස්මිමාන සමුග්ඝාතං පාපුණාති' මහණෙනි, අස්මිමානය නැති කිරීම සඳහා අනිත්‍ය සංඥාව වඩන්න. අනිත්‍ය සංඥාව වැඩීමෙන් අනාත්ම සංඥාව ඇතිවේ. අනාත්ම සංඥාව මගින් අස්මිමානය දුරු වේ. (අංගුත්තර නවක නිපාත)

අස්මිමානය දුරු කිරීමට නම්, තමන්ගේ රූපයත් නාමයත් සෑම ක්ෂණයක් පාසාම වෙනස් වෙවී වෙනස් වෙවී යන ආකාරය දත යුතු ය.
ඇස්පිල්ලක් ගැසීම වැනි ඉතා සුළු ක්‍රියාවක දී පවා තමන්ගේ මුළු ශරීරය බිඳි බිඳී යන අයුරුත්, ඒ දක්නා නාම ධර්මයන් ක්ෂය වී ක්ෂය වී යන ආකාරයත් දැකිය හැකි තරම් අනිත්‍ය දර්ශනය වැඩී තිබෙන කෙනකුට, එලෙසින් නාම-රූප ධර්ම නිරුද්ධ වෙවී නිරුද්ධ වෙවී යන කල, ''මම'' කියා ගැනීමට කිසි දෙයක් ඉතිරි නො වන බව ප්‍රත්‍යක්ෂ ලෙස පෙනී යාමෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට වේ. මේ දර්ශනය මුළු විශ්වයේ ම ඇති අජීවී සජීවී සියළු දේ කෙරෙහි පැතිරී පෙනී යන විට, කිසිම තැනක කිසිම සත්ත්වයකු නො මැති බව දක්නා අවස්ථාවේ දී මුළු විශ්වයම නිරුද්ධ වී යාමක් අත්දැකිය

හැකි ය. මෙය සාමාන්‍ය ශූන්‍යතාවයක් නොව, වතුරට දැමූ ලුණු කැටයක් දියවී නො පෙනී යන්නා සේ, මුළු විශ්වය ම දියවීයාම දක්නා දර්ශනයකි. එවිට ඉතිරිවන දැනීම් මාත්‍රයේ ඇති ස්කන්ධ ධර්මයන් නිරුද්ධ වී යාම අත්දකින විට, 'මම' කියා කෙනකු නො මැති බව ප්‍රත්‍යක්‍ෂ වෙමින් අස්මිමානය නිරුද්ධ වේ.

අස්මිමානය නිරුද්ධ වන්නේ රහත් වීමෙන් පසුව පමණක් වුවත්, සෝවාන් ආදී සෑම මාර්ග ඵලයක්ම ලැබීම සඳහා අනිත්‍ය සංඥාව ප්‍රගුණ කළ යුතු ය.

2. 'ද්වේ ධම්මා පහාතබ්බා' - අවිජ්ජා, භවතණ්හා නම් වූ ප්‍රහාණය කළ යුතු ධර්ම දෙකක් ඇත. බුදුරජාණන් වහන්සේ විසින් බොහෝවිට අවිද්‍යාව විස්තර කොට ඇත්තේ මෙලෙසිනි: 'කතමාච භික්ඛවේ අවිජ්ජා? යං ඛෝ භික්ඛවේ දුක්ඛේ අඤ්ඤාණං, දුක්ඛ සමුදයේ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධේ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාය අඤ්ඤාණං, අයං වුච්චති භික්ඛවේ අවිජ්ජා' - කුමක් ද මහණෙනි, අවිද්‍යාව කියන්නේ? දුක නො දත්කම, දුක ඇතිවීමේ හේතුව නො දත්කම, දුක නැතිකිරීම නො දත්කම, දුක නැතිකිරීමේ මාර්ගය නො දත්කම යි මහණෙනි, අවිද්‍යාව කියන්නේ. අවිද්‍යාව ප්‍රහාණය කිරීමට මාර්ග ඵල අවබෝධ කළ යුතු ය. ඉහළ ඉහළ මාර්ග ඵල ලබන විට, චතුරාර්ය සත්‍යය පිළිබඳ පවත්නා අවබෝධය ඉතා පළල්ව හා ගැඹුරින් අවබෝධ වනු ඇත.

අවිද්‍යාව නැතිකිරීමට නම්, චතුරාර්ය සත්‍යය පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් නොව, ඉතා ගැඹුරු ප්‍රත්‍යක්‍ෂාවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. දුක්ඛ සත්‍යය ගැන සුළු දැනීමක් නොව, මේ පංචස්කන්ධ ධර්මයන්ගේ පැවැත්ම ම දුකක් බව හා භවයේ එක මොහොතක්වත් රැඳී සිටීම නුසුදුසු ය යන හැඟීම තමාට ම පෙනී යාම තුළින් ඇතිවන සිතට කාවැදී යන

අවබෝධයක් දුක්ඛ සත්‍යය ගැන ඇති කර ගත යුතු ය. (අපගේ 'දුක පිරිසිඳ දකින්න' පොත ද බලන්න.)

දුක්ඛ සමුදය සත්‍යය ගැන අසන ලද කියවන ලද දේ මතක තබා ගැනීමට හෝ ඒවා තේරුම් ගැනීමට වඩා, දුක්ඛ සමුදය සත්‍යය එදිනෙදා ජීවිතයේ දී ක්‍රියාත්මක වන ආකාරයත්, එසේ ක්‍රියාත්මකවීම තුළින් සසර පුරා විඳින ලද අනන්ත අප්‍රමාණ සතර අපා ආදී සසර දුකත් අවබෝධ කර ගැනීම, දුක්ඛ සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ. **''චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති චක්ඛුසම්ඵස්සෝ. ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති''** ඇසට රූපයක් පෙනුණ පසු චක්ඛු විඥාන සිත උපදී. ඇස - රූපය - චක්ඛු විඥානය යන කොටස් තුනේ එකතුව චක්ඛු සම්ඵස්සය යි. චක්ඛු සම්ඵස්සය නිසා වේදනාවත්, වේදනාව නිසා තණ්හාවත්, තණ්හාව නිසා උපාදානයත්, උපාදාන නිසා කුශලාකුශල කර්ම භවත්, කර්ම භව නිසා ජාතියත්, ජාතිය නිසා ජරා මරණ ආදී සියලු සසර දුකත් විඳින්නට සිදු වේ. (සංයුක්ත නිකාය - සළායතන වග්ගය)

කන-නාසය-දිව-ශරීරය-මනස කියන සෙසු ඉන්ද්‍රියයන් නිසාත් ඒ ඒ ඉන්ද්‍රියයන්ට හමුවන ඉෂ්ට අරමුණු කෙරෙහි ඇලෙමින්, අනිෂ්ට අරමුණු කෙරෙහි ගැටෙමින් කර්මභව රැස්කර ගනිමින් නැවත නැවත සසර දුකට පතිත වන ආකාරය පිළිබඳව ඉතා පැහැදිලි ප්‍රත්‍යක්ෂ අවබෝධයක් තමා විසින් ම ඇති කර ගත යුතු ය. අවබෝධය යනු කියන අසන දේ තේරුම් ගැනීම නො වේ; ඒ පිළිබඳව තමන්ට ම පැහැදිලිව අවබෝධ වී පෙනී යාම ය.

දුක්ඛ නිරෝධ සත්‍යය පිළිබඳව ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ලබාගත හැක්කේ මාර්ග ඵල ලාභියකුට පමණි. ඉහළ ඉහළ මාර්ග ඵල ලබන විට, ඒ අවබෝධය වඩ වඩාත් පුළුල් වේ; ගැඹුරු වේ.

මාර්ග සත්‍යය සම්පූර්ණත්වයට පත්වන්නේ රහත් වීමෙනි. සෝවාන් ආදී සෑම මාර්ග ඵලයක්ම ලැබීම සඳහා මාර්ග සත්‍යය අනිවාර්යයෙන් ම මා විසින් ම දියුණු කර ගත යුතු ය කියන අවබෝධයේ පිහිටා, සම්මා සතිය, සම්මා සමාධිය, සම්මා දිට්ඨිය ආදී ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග දියුණු කර ගැනීමට උත්සාහ ගත යුතු ය. එසේ කටයුතු කිරීමෙන් අවිද්‍යාව ප්‍රහාණය කළ හැකි වනු ඇත.

අවිද්‍යාව සම්පූර්ණයෙන් ම නිරුද්ධ වී යන්නේ රහත් වීමෙන් පමණි. එහෙත් සෝවාන් සකෘදාගාමී අනාගාමී කියන සෙසු මාර්ග ඵල ලබන විට දී, ඒ ඒ මාර්ගඵලාවබෝධයෙන් නිරුද්ධ වී යන සංයෝජන ධර්මයන් හා සම්බන්ධ අවිද්‍යාව ක්ෂය වී යන බැවින්, ඕනෑම මාර්ග ඵලයක් ලැබීමට බලාපොරොත්තු වන අය විසින් අවිද්‍යාව දුරු කිරීම සඳහා චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය වඩ වඩාත් දියුණු කර ගැනීමට උත්සාහ ගත යුතු ය.

**භව තණ්හා** - භවයේ රැඳී සිටීමට තිබෙන ආශාව යි, භව තණ්හා යනුවෙන් හැඳින්වෙන්නේ. රහත් නොවූ සෑම කෙනකු තුළම භව තණ්හාව ඇත. භව තණ්හාව නැති කිරීමට නම්, මම-මගේ නො වන, ඒකාන්ත දුක් වූ මේ පංචස්කන්ධ ධර්ම එක මොහොතකවත් භවයේ කොතැනකවත් නො පැවතිය යුතු ය යන අවබෝධය ඇතිවන සේ දුක ගැන ඉතා පැහැදිලි ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ඇති කර ගත යුතු ය. එලෙසින්ම විශ්වයේ කිසි තැනක ස්කන්ධයන්ගේ පැවැත්මක් හැර කිසිම

සත්ත්වයෙක් නො මැති බවත්, ඒ ඒ සත්වයන් 'මම, මගේ, මගේ ආත්මය' යැයි සිතා සිටින්නේ නම් එහි තිබෙන්නේ තනිකරම අවිද්‍යාවක් බවත් අවබෝධ වෙමින් අනාත්ම ලක්‍ෂණය ඉතා ප්‍රකටව හා ප්‍රත්‍යක්‍ෂ ලෙස පෙනී, නාම රූප ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ අතිශය කලකිරීමක් ද ඇති කර ගත යුතු ය.

දිව්‍ය බ්‍රහ්ම වැනි ලෞකික උසස් සුවයක් ලැබුවත්, ධ්‍යාන සුව වැනි නිරාමිස සුවයක් ලැබුවත්, ඵල සමවත් සුව වැනි ලෝකෝත්තර සුවයක් වින්දත්, ඒ සෑම අවස්ථාවකදීම පවත්නේ ස්කන්ධ ධර්ම පමණි. පංචස්කන්ධය කෙරෙහි කලකිරිය යුතු වන්නේ එය දුක් ලබා දෙන විට දී පමණක් නො වේ. මෙවන් උසස් සුවයක් ලබා දෙන ස්කන්ධ කෙරෙහිත්, ඒවා නිත්‍ය නො වන නිසා ම සහ ඒවා තුළින් සුපුරුදු දුක් නැවත ලබා දෙන නිසා ම කලකිරිය යුතු බව හා, මේ ස්කන්ධ ධර්ම සම්පූර්ණයෙන් ම නිවීයාම හැර වෙනත් දුකේ කෙළවරක් නො මැති බව සිතට හා වැදී පෙනී යා යුතු ය.

3. 'තයෝ ධම්මා පහාතබ්බා' - කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියන ධර්ම 3 ප්‍රහාණය කළ යුතු වේ.

කාම තණ්හාව යනු ඇස-කන-නාසය-දිව-ශරීරය සහ මනස යන ඉන්ද්‍රියයන්ට ඉෂ්ට වූ, ප්‍රිය වූ අරමුණු හමු වූ පසු, ඒ කාම වස්තූන් තුළින් අත්දකින ආශ්වාදය විඳීමට තිබෙන කැමැත්ත, ඒ පිළිබඳව ඇතිවන ඡන්දය, රාගය, ඡන්දරාගය, බැඳීම ආදිය යි.

මෙය නැතිකර ගැනීමට නම්, කාමරාග-පටිඝ කියන ධර්ම දෙකම තමාගේ සිත තුළ සිතුවිලි ටිකක් ඇතිවී නැතිවී යාම හැර වෙන දෙයක් නො වන බවත්, කාම රාග පටිඝ ජනිත වන්නේ බාහිර අරමුණු කෙරෙහි නොව තමන්ගේ ම පංචස්කන්ධ ධර්ම කෙරෙහි බවත්, තමන් ඇලෙන්නේ බැඳෙන්නේ ගැටෙන්නේ තමාගේ ම

පංචස්කන්ධ ධර්ම කෙරෙහි විනා බාහිර අරමුණු කෙරෙහි නො වන බවත් ප්‍රත්‍යක්ෂ ලෙසම අවබෝධ කර ගෙන, අනිත්‍යයෙන් නිරුද්ධ වී යන මේ පංචස්කන්ධ ධර්ම තමා හෝ තමාට අයත් දෙයක් නො වන බව දැක, මේ ස්කන්ධ ධර්ම මෙලෙසින් ඇති වුවත්, නැති වුවත් කවර නම් අර්ථයක් දැයි ප්‍රත්‍යක්ෂ ලෙසම සිතට කා වැදී පෙනී යන සේ අවබෝධ වී යා යුතු ය.

උදාහරණයකට ප්‍රිය රූපයක් දැක ආදරයක්, ආශාවක් ඇතිවන විට, එය තම සිත තුළ හුදු නාම ධර්ම ටිකක් ඇතිවී නැතිවී යාම පමණක් බව තේරුම් ගත යුතු ය. ඒ නාම ධර්ම ඇතිවී නැතිවී යයි. එපමණ ය. සෙසු ඉන්ද්‍රියයන් සම්බන්ධයෙන් ද සිදු වන්නේ මෙයම පමණි.

මෙලෙසින් ඇතිවී නැතිවී යන කිසිදු වටිනාකමක් නැති අසාර නාම ධර්මයන්ට ඇලීම නිසා සංසාරය පුරා තමන් විඳින ලද අපා දුක්, ප්‍රේත ලෝකවල දුක්, තිරිසන් ලෝකවල දුක්, ජාති ජරා මරණ ආදී අනන්ත අප්‍රමාණ සංසාර දුක් පෙනී, මෙවැනි දුක් ලබා දුන්, ලබා දෙන මේවා කෙරෙහි ඇලීමේ ඇති මෝඩකම අවබෝධ වී පෙනී යා යුතු ය. (අපගේ ලොව්තුරු හුදකලාව පොතේ ගාථා 16-17-26-27-28 ද බලන්න.) කාම තණ්හාව අනාගාමී වීමෙන් දුරු වේ.

භව තණ්හාව මීට පෙර විස්තර කොට ඇත.

විභව තණ්හාව යනුවෙන් අදහස් කරන්නේ, මරණයෙන් පසු සියල්ල නිම වේ යැයි සිතා, ජීවත්ව සිටිනතාක් කල් ඉන්ද්‍රියයන් පිණවමින් සතුටු වීමට ඇති කැමැත්ත යි. මෙය කාම තණ්හාවම වෙනත් ස්වරූපයකින් ක්‍රියාත්මක වීමකි.

4. '**චත්තාරෝ ධම්මා පහාතබ්බා**' - ධර්ම 4 ක් ප්‍රහාණය කළ යුතු ය. කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ එසේ ප්‍රහාණය කළ යුතු ධර්ම 4 යි. ඕඝ කියන වචනයේ අදහස

මහා සැඩ පහරක්, විශාල ජල ප්‍රවාහයක් යන්න යි.

කලින් දක්වා ඇති කාම තණ්හා, භව තණ්හා, අවිජ්ජා කියන කරුණුම කාම ඕඝ, භව ඕඝ, අවිජ්ජා ඕඝ වශයෙන් දක්වා ඇති නමුත්, එය මෙහි දැක්වෙන්නේ වෙනත් ස්වරූපයකින් හා වෙනත් දෘෂ්ටි කෝණයකිනි. දිට්ඨි ඕඝ යනු වැරැදි ආකාර විවිධ දෘෂ්ටීන් උපාදාන කර ගෙන, ග්‍රාහණය කර ගෙන සිටීම යි. කාම ඕඝ ආදී මේ සැඩ පහර වලට හසු වූ සත්ත්වයන්, විශාල ජල ප්‍රවාහයකට හසු වූ දෙයක් ගසාගෙන ගසාගෙන යන්නා සේ, සංසාරය පුරා ගසාගෙන ගසාගෙන, ඇදගෙන ඇදගෙන යන ආකාරය තේරුම් ගත යුතු ය. ජල ප්‍රවාහයකට හසු වූ කෙනකුට ගොඩ එන්නට නො හැකි වන්නා සේ, මේ ඕඝයන්ට හසු වූ සත්ත්වයන්ට සසරින් එතර වීමට ඉඩ නො දෙන ආකාරය තේරුම් ගන්න. දෙවියෙක්, බ්‍රහ්මයෙක්, මාරයෙක් ආදී කවර සත්ත්වයෙක් වුවත් ඕඝයන්ට හසු වූ විට සසරින් මිදීමට අවකාශයක් නො ලබයි.

දිට්ඨි ඕඝය සෝවාන් වීමේ දී ක්‍ෂය වී යන අතර, පංචකාම වස්තූන් පිළිබඳ කාම ඕඝය සකෘදාගාමී මාර්ගයෙන් තුනී වී අනාගාමී මාර්ගයෙන් සම්පූර්ණයෙන් ක්‍ෂය වේ. සෙසු ඕඝ ධර්මයන් ක්‍ෂය වන්නේ රහත් වීමෙනි.

5. **'පඤ්ච ධම්මා පහාතබ්බා'**- කාමච්ඡන්ද-ව්‍යාපාද-ථීනමිද්ධ-උද්ධච්ච කුක්කුච්ච-විචිකිච්ඡා යන පංච නීවරණ ධර්ම ප්‍රහාණය කළ යුතු වේ. කාම වස්තූන් තුළින් ඇතිවන ආශ්වාදය විඳීමට ඇති කැමැත්ත කාමච්ඡන්දය යි. තරහව අමනාපය-නුරුස්නාගතිය ආදී පටිඝ සම්ප්‍රයුක්ත සිතුවිලි ව්‍යාපාදය යි. ථීනමිද්ධය යනුවෙන් දැක්වෙන්නේ නිදිමත ගතිය හා කයේ හෝ සිතේ ඇතිවන අලස ඇලි-මැලි දුබල ගතිය යි. සිත එක අරමුණක පිහිටුවා ගත නො හැකිසේ සිත විසිරෙන ගතිය උද්ධච්චය වන අතර,

කරන ලද අකුශල් හෝ නො කළ කුශල් ගැන සිත සිතා පසුතැවීම කුක්කුච්චය නමින් හැඳින් වේ.

කාමච්ඡන්දෝ භික්ඛවේ ආවරණෝ නීවරණෝ චේතසෝ අජ්ඣාරුහෝ පඤ්ඤාය දුබ්බලීකරණෝ... ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් වදාරා ඇති පරිදි, මෙම නීවරණ ධර්මයන් නිවන සහ නිවන් මග ආවරණය කරන්නේ ය, සිත වසාගෙන සිටින්නේ ය, සිත මැඬගෙන සිටින්නේ ය, ප්‍රඥාව දුබල කරන්නේ ය. (අංගු.නිකාය) සෝ වත භික්ඛවේ භික්ඛු, ඉමේ පඤ්ච ආවරණේ නීවරණේ චෙතසෝ අජ්ඣාරුහේ පඤ්ඤාය දුබ්බලීකරණේ අප්පහාය අබලාය පඤ්ඤාය දුබ්බලාය අත්තත්ථංවා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමමරියඤාණදස්සන විසේසං සච්ඡිකරිස්සතී'ති නේතං ඨානං විජ්ජති. (අංගු.නිකාය)
මහණෙනි, මේ නීවරණ ධර්මයන් පහා නො තබා, අබල වූ, දුර්වල වූ ප්‍රඥාවකින්, ආත්මාර්ථය හෝ පරාර්ථය හෝ ආත්මාර්ථය හා පරාර්ථය යන දෙකම හෝ ධ්‍යාන-මාර්ග-ඵල-නිර්වාණය හෝ සාක්ෂාත් කරන්නේ ය යන කරුණ සිදු නො වේ.

මෙම නිසා ධ්‍යාන-මාර්ග-ඵල-නිර්වාණය සාක්ෂාත් කිරීමේ අටියෙන් භාවනා කරන අය විසින් නීවරණ ධර්ම මැඩ ගැනීමට අනිවාර්යයෙන් ම උත්සාහ ගත යුතු ය.

6. ඡ ධම්මා පහාතබ්බා - ඡ තණ්හාකාය වශයෙන් දැක්වෙන රූප තණ්හා-ශබ්ද තණ්හා-ගන්ධ තණ්හා - රස තණ්හා-ඵොට්ඨබ්බ තණ්හා-ධම්ම තණ්හා යන තණ්හා කොටස් 6 ද ප්‍රහාණය කළ යුතු ධර්මයන් ය.

''චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං...'' ආදී වශයෙන් මෙයට පෙර සඳහන් කර ඇති පරිදි, ඇසට රූපයක් හමු වූ පසු ඒ රූපය පිළිබඳව

ඇතිවන දැනීම චක්ඛු විඥානය යි. ඒ නිසා ඇතිවන ස්පර්ශය නිසා වේදනාවත්, වේදනාව නිසා තණ්හාවත් ජනිත වේ.
තණ්හාව සත්‍ය වශයෙන්ම ඇතිවන්නේ තම සිත තුළ පහළවන සුඛ වේදනාවට වුවත්, ඒ වේදනාව ගෙන දීමට දකින ලද රූපය හේතු වන බැවින් එය රූප තණ්හා වශයෙන් මෙහි දක්වා ඇත.
ශබ්ද තණ්හා-ගන්ධ තණ්හා ආදී තණ්හාවේ සෙසු කොටස් ද මේ අනුසාරයෙන් තේරුම් ගත යුතු ය.

සසර දුකේ නිමග්න කරවීමට හේතු වන තණ්හාව සැපක් ලබා දෙන්නක් නොව, දුක්ඛ සමුදය සත්‍යය ක්‍රියාත්මක වීමක් බව අවබෝධ කර ගෙන, රූපාදී අරමුණු කෙරෙහි පවත්නා තණ්හාව හැකි තරම් දුරට අඩු කර ගැනීමට හෝ උත්සාහ කිරීම ඉතා සුදුසු ය.

විශේෂයෙන් ම අතීත සංසාරයේ විඳින ලද අනන්ත අප්‍රමාණ දුක තේරුම් ගෙන, ඒ මහා සසර දුකට ඇද දැමීමට හේතු වූ රූප තණ්හා ආදිය නිසා ඇතිවන සුඛාශ්වාදය කෙරෙහි අතිශයින් බිය විය යුතු බව වටහා ගත යුතු ය. **භායිතබ්බං ඒතස්ස සුඛස්සාති වදාමි** - ඒ කාම සුඛයට බිය විය යුතු යැයි බුදුරජාණන් වහන්සේ වදාළේ එබැවිනි.
මෙසේම රූප තණ්හා ආදිය ඇතිවීමට හේතුපාදක වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ යනාදී අරමුණු තමා පිනවීමට තිබෙන දේවල් නොව, මාරයාගේ ඇමක් සේ වටහා ගෙන, තණ්හාව ජනිත වන සෑම අවස්ථාවක දී ම තමන්ගේ ම පංචස්කන්ධ ධර්ම කෙරෙහි පවත්නා ඡන්දරාගය පහළවීම පමණක් සිදුවන බව අවබෝධ කර ගනිමින් පංචස්කන්ධ ධර්ම කෙරෙහි අතිශය කලකිරීමක් ඇතිවන ආකාරයෙන් නුවණින් සම්මර්ශනය කිරීම, රූප තණ්හාදිය මැඩපවත්වා ගැනීමට බෙහෙවින් උපකාරී වේ.

අනාගාමී වීමෙන් පංචකාම වස්තූන් හා සම්බන්ධ රූප තණ්හා-ශබ්ද තණ්හා-ගන්ධ තණ්හා-රස තණ්හා සහ ඵොට්ඨබ්බ තණ්හා කියන තණ්හාවේ කොටස් ප්‍රහාණය වන අතර, තණ්හාවේ සෙසු කොටස් ප්‍රහීණ වන්නේ රහත් වීමෙනි.

7. **සත්ත ධම්මා පහාතබ්බා, සත්තානුසයා** - කාමරාග-පටිඝ-මාන-දිට්ඨි-විචිකිච්ඡා-භවරාග-අවිජ්ජා යන අනුශය ධර්ම 7 ප්‍රහාණය කළ යුතු වේ. මෙම අනුශය ධර්ම, මතු වී ඒමට හේතු වූ අරමුණක් හමු වූ පසු, අයෝනිසෝමනසිකාරයෙන් යුතුව කටයුතු කරන ඕනෑම අවස්ථාවක දී සිත තුළින් පැන නැගිය හැකි කෙලශ ධර්මයන් වේ.

කෙලශ ධර්මයන්ගේ අවස්ථා 3 ක් ඇත. සිත තුළ මේවා ඇති බව පවා නො තේරෙන තරමට මතු නො වී, යටපත්ව පවත්නා අවස්ථාව '**ශයිත අවස්ථාව**' වශයෙන් හැඳින්වේ. අනුශය ධර්ම වශයෙන් ගණන් ගනු ලබන්නේ මෙම අවස්ථාවේ සිත තුළ පවත්නා යට කී කෙලශ ධර්මයන් ය. අනුශය ධර්ම මතු වී ඒමට සුදුසු කරුණක් පැමිණි වහාම එම කෙළෙස් ධර්ම පැන නැගී සිටින කල, එය '**පරියුට්ඨාන අවස්ථාව**' ලෙසින් හැඳින්වෙන අතර, එසේ මතු වී ආ පසු, කායික වාචසික මානසික ක්‍රියා සිදුකරන අවස්ථාව හැඳින්වෙන්නේ '**ව්‍යතික්‍රමණ අවස්ථාව**' වශයෙනි.

අනුශය ධර්ම ප්‍රහාණය කළ හැකි වන්නේ මාර්ග ඵල අවබෝධ කිරීමෙන් පමණි. සෝවාන් වීමේ දී දිට්ඨි-විචිකිච්ඡා අනුශයන් ද, අනාගාමී වීමේදී කාමරාග-පටිඝ අනුශයන් ද, රහත් වීමේ දී මාන-භවරාග-අවිජ්ජා අනුශයන් ද ප්‍රහීණ වේ.

සතියෙන් හා යෝනිසෝමනසිකාරයෙන් යුතුව කටයුතු

කිරීමෙන් අනුශය ධර්ම පැන නැගීම යටපත් කරගත හැකි ය.

8. **අත්ථි ධම්මා පහාතබ්බා, අත්ථි මිච්ඡත්තා** - මිච්ඡා දිට්ඨි- මිච්ඡා සංකප්ප-මිච්ඡා වාචා-මිච්ඡා කම්මන්ත-මිච්ඡා ආජීව-මිච්ඡා වායාම-මිච්ඡා සති-මිච්ඡා සමාධි යන මිච්ඡත්ත වශයෙන් හැඳින්වෙන ප්‍රහාණය කළ යුතු ධර්ම 8 ක් ඇත. 'මිච්ඡත්ත' යන්නෙහි සාමාන්‍ය අදහස 'වැරැදිබව' ය. මෙම මිච්ඡත්ත ධර්මයන් සම්මා දිට්ඨි ආදී ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ප්‍රතිවිරුද්ධ ධර්මයන් වේ. මෙම මිච්ඡත්ත ධර්ම මාර්ග-ඵල-නිර්වාණ අවබෝධය ලබා දෙන්නක් නොව, එය වළක්වාලනු ලබන ධර්මයන් බව අංගුත්තර නිකායේ මිච්ඡත්ත සූත්‍රයේ "**මිච්ඡත්තං භික්ඛවේ ආගම්ම විරාධනා හෝති නො ආරාධනා**" යනාදී වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් වදාරා තිබේ.

**සම්මා දිට්ඨිකස්ස භික්ඛවේ මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හෝති, යේච මිච්ඡා දිට්ඨි පච්චයා අනෙකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තේ චස්ස නිජ්ජිණ්ණා හොන්ති** ආදී වශයෙන් අංගුත්තර නිකායේ නිජ්ජර සූත්‍රයේ දැක්වෙන පරිදි, සම්මා දිට්ඨි ආදී ආර්ය අෂ්ඨාංගික මාර්ගාංගයන් වැඩීමෙන් මිච්ඡා දිට්ඨි ආදී මිච්ඡත්තයන් ද, මිච්ඡත්ත ධර්ම නිසා පහළවන විවිධාකාර අකුශල ධර්මයන් ද නැති කර දැමිය හැකි වේ. සම්මා දිට්ඨිය වැඩීමෙන්, මිච්ඡා දිට්ඨිය නැති කළ හැකි ය. සම්මා සංකප්පයන් වැඩීමෙන්, මිච්ඡා සංකප්ප යටපත් කළ හැකි ය. සෙසු ආර්ය අෂ්ඨාංගික මාර්ගාංග වැඩීමෙන්, ඒ ඒ මාර්ගාංගයට ප්‍රතිවිරුද්ධ ඒ ඒ මිච්ඡත්ත ධර්ම නැසෙන බව තේරුම් ගෙන, මිච්ඡත්ත ධර්ම ප්‍රහාණය කිරීම සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගය තව තවත් දියුණු කර ගැනීමට උත්සාහ ගත යුතු ය.

විදර්ශනා භාවනාව තුළින් තාවකාලික වශයෙන් මිච්ඡත්ත ධර්ම නැති කර ගත හැකිවන අතර, මාර්ග ඵල අවබෝධ කිරීම තුළින් නැවත නූපදින ලෙසින් ම ඒවා ප්‍රහීණ කළ හැකි වේ. සෝවාන් වීමෙන් මිච්ඡා දිට්ඨි-මිච්ඡා කම්මන්ත-මිච්ඡා ආජීව යන මිච්ඡත්තයන් ද, අනාගාමි වීමෙන් මිච්ඡා සංකප්ප මිච්ඡත්තය ද, රහත් වීමෙන් සෙසු මිච්ඡත්තයන් ද සම්පූර්ණයෙන් ප්‍රහීණ වේ.

9. **නව ධම්මා පහාතබ්බා, නව තණ්හා මූලකා ධම්මා -** තණ්හාව මුල්කොට ඇතිවන, තණ්හා මූලක ධම්ම වශයෙන් හැඳින්වෙන කරුණු 9 ද ප්‍රහාණය කළ යුතු ය.

(i) **තණ්හං පටිච්ච පරියේසනා:** තණ්හාව නිසා අරමුණු සෙවීම සිදු වේ. ප්‍රිය රූප දක ආශ්වාදයක් විඳීමට ඇතිවූ තණ්හාව විසින්, සත්ත්වයා චිත්‍රපට - ටෙලිනාට්‍ය ආදී රූප දර්ශන කරා ඇදගෙන යනු ලබයි. මෙසේම ශබ්දාශ්වාදයට තණ්හාව ඇතිවූ අය සංගීත සංදර්ශන ආදී ප්‍රිය ශබ්ද සොයා යන්නේ ද, ඒ තණ්හාව තුළින් ඔවුන් ඇදගෙන යනු ලබන බැවිනි. '**තණ්හාය නීයති ලෝකෝ**' යනුවෙන් වදාළේ එබැවිනි. මේ අයුරින් ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම තණ්හාවන් නිසා ඒ ඒ අරමුණු සෙවීම් සිදු වන බව ද අවබෝධ කර ගන්න.

මෙහි දී ඇතිවන්නේ ලෝභ මූල අකුශල සිත් බවත්, එය දුක් ලබා දීමට හේතු වන දුක්ඛ සමුදය සත්‍යය ක්‍රියාත්මක වීමක් බවත්, ආශ්වාද-තණ්හාව ආදී කරුණු හුදු නාම ධර්ම ඇති වී නැති වී යාමක් පමණක් බවත්, තමා හෝ තමාගේ නො වන ඒ නාම ධර්ම ඇති වී නැති වී ගිය පසු කිසිවක් ශේෂ නො වන බවත්, එසේ නිරුද්ධ වී ගිය- නිරුද්ධ වී යන ඒ ධර්මයන්ගේ කිසිම සාරයක් නැති බවත්

ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කර ගත් විට, මෙය බොහෝ දුරට අඩු කර ගැනීමට හැකි වේ.

(ii) **පරියේසනං පටිච්ච ලාභෝ:** මෙලෙසින් සෙවීම නිසා ඒ ඒ අරමුණු ලැබේ. මෙසේ ලැබෙන්නේ අති දීර්ඝ සංසාරයේ අප රැඳවූ, අනන්ත අප්‍රමාණ දුක් ලබා දීමට හේතු වූ අරමුණු බව තේරුම් ගැනීම සුදුසු ය. එවන් ප්‍රත්‍යක්ෂාවබෝධයක් ගැඹුරින් ඇතිවූ විට මෙම අරමුණු කෙරෙහි ඇතිවන්නේ ඇලීමක් නො වේ; මහත් බියකි.

(iii) **ලාභං පටිච්ච විනිච්ඡයෝ:** ඒ අරමුණු ලැබුණු පසු, 'මේවා ඉෂ්ට කාන්ත ප්‍රිය මනාප සුව ගෙන දෙන අරමුණු ය, මේවා අනිෂ්ට අකාන්ත අප්‍රිය අමනාප අරමුණු ය' ආදී වශයෙන් නිශ්චය කිරීමක් සිදු වේ. එසේම, 'මේවා මට ය, මේවා මගේ දූ පුතුන් ආදීන්ට ය, මේවා ඉතිරි කර ගැනීම සඳහා ය' ආදී විනිශ්චයන් ද ඇති විය හැකි ය. මේවා බොහෝ විට අකුශල විතර්ක බව අවබෝධ කර ගත යුතු ය.

(iv) **විනිච්ඡයං පටිච්ච ඡන්දරාගෝ:** මෙසේ ඇතිවූ අකුශල විතර්කිත අරමුණු කෙරෙහි ඡන්දරාගයක් ඇති වේ. එය ම උපාදාන ජනිත වීමකි.

(v) **ඡන්දරාගං පටිච්ච අජ්ඣෝසානං:** ඡන්දරාගය ඇතිවීම නිසා, ''මම-මගේ'' යැයි බලවත් විනිශ්චයක් සිදු වේ.

(vi) **අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහෝ:** ඒ බලවත් සනිටුහන නිසා, තණ්හාවෙන් හෝ, දිට්ඨියෙන් හෝ, මානයෙන් හෝ, බලවත් වූ ග්‍රාහණය කිරීමක් ඇති වේ.

(vii) **පරිග්ගහං පටිච්ච මච්ඡරියං:** ඒ ග්‍රාහණය නිසා මසුරු බවක් ජනිත වේ. එවිට එසේ ග්‍රාහණය කළ තමන්

සතු දේවල් අන් අයට අයිතිවීම හෝ, අන් අය ඒවායින් ප්‍රයෝජන ගැනීම හෝ, සමහරවිට අන් අය ඒවා අතපත ගෑම කෙරෙහි පවා හෝ අකැමැත්තක් ඇතිවනු ඇත.

(viii) මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ: මේ මසුරුකම නිසා ආරක්‍ෂා කිරීමට සිදු වේ.

(ix) ආරක්ඛාධිකරණං පටිච්ච දණ්ඩාදාන-සත්ථාදාන-කලහ-විග්ගහ-විවාද-තුවං තුවං-පේසුඤ්ඤ-මුසාවාදා-අනෙකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති: ආරක්‍ෂා කිරීමට යාම නිසා දඬුමුගුරු ගැනීම්, අවි ආයුධ ගැනීම්, විවාද කල කෝලාහල ඇතිවීම්, අපවාද කිරීම්, කේළාම් කීම්, බොරු කීම් ආදී අනේකවිධ අකුශල ධර්මයෝ පහළවෙත්.

ආරක්‍ෂා කිරීමට යමක් කිසිසේත් ම නැතිනම්, දඬුමුගුරු ආදිය ගැනීමක් සිදු නො වේ. මසුරුකමක් කිසිසේත් ම නැතිනම්, ආරක්‍ෂා කිරීමක් ද නැත. මම මගේ යැයි තදින් ගැනීමක් නැතිනම්, මසුරුකමක් නොමැත. මේ ආදී ලෙසින් මේ එක් එක් කරුණක් සම්පූර්ණයෙන් ම නැතිනම්, ඒ නිසා ඇතිවන ඒ ඒ කරුණු ද ජනිත නො වන බව මහා නිදාන සූත්‍රයේ දක්වේ.

මෙම තණ්හා මූලක ධර්ම ක්‍රියාත්මක වීමේ දී සිදු වන්නේ තණ්හාව නිසා උපාදානයත්, උපාදාන නිසා කර්ම භවත් රැස්වෙමින්, දුක්ඛ සමුදය සත්‍යය ක්‍රියාත්මක වීම තුළින් සසර දුක වැඩි වීම බව තේරුම් ගත යුතු ය.

10. දස ධම්මා පහාතබ්බා, දස මිච්ඡත්තා - දස මිච්ඡත්ත ධර්මයන්ගෙන් කරුණු 8 ක් අට්ඨ මිච්ඡත්තයන් දක්වීමේ දී ඉහතින් දක්වා ඇත. මිච්ඡා ඤාණ-මිච්ඡා විමුත්ති යන කරුණු දෙක ද එක් වූ විට මිච්ඡත්ත 10 කි.

මිච්ඡා විමුත්ති: විමුත්තිය යනු සංයෝජන, අනුශය ආදී

කෙලශ නැවත නූපදින ලෙසින් ම නසා, මාර්ග ඵල අවබෝධ කොට සසර දුකින් මිදීම ය.

භාවනාවෙන් අත්දැකීමක් ලබා හෝ නො ලබා, සෝවාන් ආදී මාර්ග ඵලයක් සත්‍ය වශයෙන් නො ලබා ම, 'මම සෝවාන් වීමි, සකෘදාගාමී වීමි, අනාගාමී වීමි, රහත් වීමි,' යැයි මුළාවෙන් රැවටී සිටින අවස්ථා ද ඇත. මෙය හැඳින්වෙන්නේ 'අධිමානය'' නමිනි. සත්‍ය වශයෙන් ම විමුත්තියක් නො ලබා, විමුත්තියක් ලබා ඇතැ'යි සිතා සිටිනා අධිමානී බව මිච්ඡා විමුත්තිය යනුවෙන් හැඳින් වේ.

මිච්ඡා ඤාණ: සැබැවින්ම විමුත්තිය ලැබූ කෙනකුට, 'මා විසින් මාර්ග ඵල ලැබුවේ මෙලෙසින් මෙම සංයෝජන අනුශය ධර්මයන් නැසීමෙන් යැ'යි ප්‍රත්‍යක්ෂ ලෙස ම දැකිය හැකි ය. එය විමුත්ති ඥාන දර්ශනයකි. මෙය මාර්ග ඵල අවබෝධ කිරීමෙන් පසුව, නිරායාශයෙන්ම හෝ ප්‍රත්‍යවේක්ෂා ඥාන උපදවා ගැනීම තුළින් අත්දැකිය හැකි ය. මිච්ඡා විමුත්තියකින් රැවටී සිටිනා කෙනකුට ද, මා විමුත්තිය ලැබුවේ මේ මේ අන්දමින් යැ'යි මුළාවක් ඇති වේ. එය මිච්ඡා ඤාණයකි.

මීට අමතරව ලෞකික දේවල් සම්බන්ධයෙන් මිච්ඡා ඤාණ ඇතිවන අවස්ථාවන් ද ඇත. උදාහරණ වශයෙන් මහා පරිමාණ මංකොල්ලයක් වැනි දෙයක් ඉතා සැළසුම් සහගතව, කිසිදිනක කිසිවකුට හසු නො වන පරිදි සිදු කර, 'මගේ නුවණින් මම මෙසේ කළා යැ'යි කෙනකුට සිතිය හැකි ය. මෙය නුවණක් නො ව, මිච්ඡා ඤාණයකි; මෝහයකි.

(සම්මා දිට්ඨිය හා සම්බන්ධ මෙම කරුණු ගැන කරනු ලබන විස්තරය ඊළඟ පොත හා සම්බන්ධ යි.)

# ජරා මරණ දැකීමෙන් නිවන් අවබෝධ කර ගැනීම

අප ගිය වාරයේ දී කීවා ජරා මරණය කුමක් ද, ජරා මරණ සමුදය මොකක් ද, ජරා මරණ නිරෝධය මොකක් ද, ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව මොකක් ද කියන කරුණු 4 යම්කිසි කෙනෙක් හරියට අවබෝධ කර ගත්තා නම්, එතෙකින්ම කෙනකුගේ සිත තුළ සම්මා දිට්ඨිය පිහිටියා වෙනවා කියන කරුණ. ඊට අමතරව ජරා මරණ - ජරා මරණ සමුදය - ජරා මරණ නිරෝධය - ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව කියන කරුණු අවබෝධ කිරීම තුළින් රහත් භාවය දක්වාම ලබා දුක කෙළවර කරන්නට පුළුවන් කියන කරුණත් ගිය වාරයේ දී අප මේ අයට කීවා.

**ජරා මරණ දුක චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීම**

ජරා මරණ කියනකොට මේ අයට තේරෙන්නට ඕනෑ ජරා මරණ කියන්නේ දුක්ඛ සත්‍යය කියලා. **ජාති'පි දුක්ඛා - ජරා'පි දුක්ඛා - මරණම්'පි දුක්ඛං** ආදී වශයෙන් ජරාවත් දුකක්, මරණයත් දුකක් කියලා බුදුරජාණන් වහන්සේ වදාළා. එතකොට ජරා මරණ කියන එකෙන් අදහස් කරන්නේ තනිකරම දුක්ඛ සත්‍යය. ජරා මරණ සමුදය කියන්නේ එහෙනම් දුක්ඛ සමුදය සත්‍යය. ජරා මරණ නිරෝධය කියන්නේ නිරෝධ සත්‍යය. ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව කියන්නේ මාර්ග සත්‍යය.

එතකොට ජරා මරණ ගැන හරි අවබෝධයක් ඇතිකර ගන්නා කෙනකු දුක්ඛ සත්‍යය යි පැහැදිලිව දකින්නේ. මේ ජීවිතයේ දීත් අපි ජරාවට පත්වෙනවා, මරණයට පත්වෙනවා, අපිට ජරා දුක් විඳින්නට සිදු වෙනවා, මරණ දුක් විඳින්නට සිදු වෙනවා. මේ ජීවිතයේ දී පමණක් නො වෙයි, අතීත සංසාරයේ කෙළවරක් නැතිව, සීමාවක් නැතිව අසීමිත වාර ගණන් අසංඛ්‍ය අසංඛ්‍ය අසංඛ්‍ය අසංඛ්‍ය කල්ප ගණන් තිස්සේ ඉපදි ඉපැදී මැරි මැරී ආ එක තමන්ට දකින්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. එතකොට

ජරා මරණ ගෙන දෙන නැවත නැවත ඉපදි ඉපදී යන එක මහා දුකක් කියලා පෙනෙනවා. එලෙසින්ම අනාගතයේ දීත් සෝවාන්වත් නො වූවොත් කෙළවරක් නැතිව සංසාරයේ ගමන් කරමින් සසර දුක් විඳින්නට සිදු වන බවත් තේරෙනවා. එලෙසින් සසර දුක තේරෙනකොට තමයි ඒ දුක කෙරෙහි කලකිරීමක් ඇතිවන්නේ, නො ඇල්මක් ඇතිවන්නේ.

දුක දන්නේ නැති කෙනකුට මේවා කෙරෙහි කලකිරීමක් ඇතිවන්නේ නැහැ. තමන්ගේ ඇඟ කෙරෙහි, තමන්ගේ සිත කෙරෙහි, මේ පංචස්කන්ධ ධර්මයන් කෙරෙහි කලකිරීමක් ඇති නො වන නිසා, මේවා කෙරෙහි ඇලී බැඳී කටයුතු කරනවා, මේවා උපාදාන කරගෙන කටයුතු කරනවා.

ජරා මරණ ගැන හරි අවබෝධයක් ඇතිවීම තුළින් දුක්ඛ සත්‍යය ගැන ඒ ආකාරයේ පැහැදිලි අවබෝධයක් ඇති කර ගන්නා විට, මේ දුක කෙරෙහි කලකිරෙනවා. එසේ කලකිරෙන කොට මේ දුක නැති කර ගන්නට ඕනෑ කියන අදහස පහළවනවා. ඒ අදහස ඇතිවනකොට, දුක ඇතිවීමේ හේතුවක් තිබෙනවා. ඒ හේතුව නැති කිරීමෙන් තමයි දුක නැති කර ගන්නට හැකි වන්නේ කියන කරුණ නුවණ ඇති කෙනකුට අවබෝධ වී පෙනී යනවා. එතකොට දුක ඇතිවීමේ හේතුව ඔහු දකිනවා. ඒ හේතුව ඇතිවුණේ මොන මොන කරුණු නිසා ද කියාත් දකිනවා. ඒක නැති කරන්නට නම් දුක නැති කිරීමේ මාර්ගයක ගමන් කරන්නට ඕනෑ කියලා අවබෝධ කර ගෙන, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරමින් සමථ විදර්ශනා ආදී භාවනා කරමින් කටයුතු කරන කෙනකුට ජරාමරණ දුක අවබෝධ වීම නිසාම සසර දුක කෙළවර කරන්නට පුළුවන් ශක්තිය ලැබෙනවා.

මෙලෙසින් චතුරාර්ය සත්‍යය ධර්මයන් පැහැදිලිව ම ප්‍රත්‍යක්ෂ ලෙස හරියට අවබෝධ කර ගත්තා නම්, ඒ තුළින් සෑම මාර්ග ඵලක්ම ලබන්නට පුළුවන්කම තිබෙන නිසා තමයි, ජරා මරණ ආදී කරුණු අවබෝධ කර ගැනීමෙන් රහත්භාවය වුවත් ලැබිය හැකි බව ඒ සූත්‍රයේ දක්වෙන්නේ.

**ජරා මරණ සමුදය දැක පටිච්ච සමුප්පාද ධර්මයන් අවබෝධ කර ගැනීම**

ඊළඟට ජරා මරණ සමුදය **ජාති සමුදයා, ජරා මරණ සමුදයෝ** - ජාතිය තමයි ජරා මරණ සමුදය. ඉපදීම ඇතිවීම නිසා තමයි ජරාවත් එන්නේ, මරණයත් එන්නේ. ජාතිය නිසා ජරා මරණ ඇතිවෙනවා කියනකොටම මෙතන හේතු ඵල ක්‍රියාදාමයක් සිදු වෙන බව පැහැදිලිව කෙනකුට තේරුම් ගන්නට පුළුවන් වෙන්නට ඕනෑ. ජාතිය හේතුව. ජරා මරණය ඵලය.

ජාතිය ඇතිවෙන්නටත් යම්කිසි හේතුවක් තිබෙනවා. කර්මභව නිසයි ජාතිය ඇතිවන්නේ. කර්මභව ඇතිවන්නෙත් යම්කිසි හේතුවක් මත. උපාදාන නිසා කර්මභව සිදු වෙනවා. උපාදාන ඇතිවීමටත් හේතුවක් තිබෙනවා. තණ්හාව නිසා එය ඇතිවෙනවා. මේ විධියට මේ කරුණු ගැන මැනවින් අවබෝධ කර ගෙන, අවබෝධ කර ගෙන යන කෙනකුට පටිච්ච සමුප්පාද ධර්මයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් අත්දකින්නට පුළුවන් වෙනවා.

පටිච්ච සමුප්පාද ධර්මයන්ගේ ප්‍රතිලෝම පැත්ත දකිමින් ඒවායේ නිරුද්ධ වී යාම දක්නා කෙනකුට ඒ තුළින් වුවත් නිර්වාණ ධාතුව අවබෝධ කර ගන්නට පුළුවන්.

**ජාති නිරෝධා, ජරා මරණ නිරෝධෝ** - ජාතිය නිරුද්ධ වුනා නම් ජරා මරණ නිරුද්ධ යි. **භව නිරෝධා ජාති නිරොධෝ** - කර්මභව නිරුද්ධ වුනා නම් ජාතිය නිරුද්ධ වනවා. **උපාදාන නිරෝධා භව නිරෝධෝ** උපාදාන නිරුද්ධ වුනා නම්, භවය නිරුද්ධ වෙනවා. මෙලෙසින් ආපස්සට පටිච්ච සමුප්පාද ධර්මයන්ගේ නිරෝධය දකිමින් දකිමින් යම්කිසි කෙනෙක් හරියට භාවනාවක නියැලෙනවා නම්, ඒ තුළින්මත් ඔහුට නිවන අවබෝධ කරන්නට හැකි වෙනවා.

ජරා මරණ - ජරා මරණ සමුදය ආදිය පිළිබඳව මෙලෙසින් ඇති කර ගනු ලබන මෙම ඥානත් තනිකරම සංස්කාර ධර්ම රාශියක්. තමා ඇතිකර ගන්නවා නො වෙයි, තමන්ගේ ඥානයත් නො වෙයි. අනාත්ම යි. මෙම අනාත්ම ලෙසින් දැකීම පවා සංස්කාර ධර්ම පමණ යි.

ජාති පච්චයා ජරා මරණන්ති ඤාණං ජාතිය නිසා ජරා මරණ ඇතිවෙනවා කියලා ඒ පිළිබඳව තමාගේ සිත තුළ නුවණක් ඇතිවෙන බව දකින්නට පුළුවන්.

අසති ජාතියා, නත්ථි ජරා මරණන්ති ඤාණං ජාතිය නැත්නම්, ජරා මරණයක් නැහැ කියලත් නුවණක් ඇතිවෙනවා.

අතීතම්පි අද්ධානං ජාති පච්චයා ජරා මරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරා මරණන්ති ඤාණං අතීතයේත් ජාතිය නිසා තමයි ජරා මරණ ඇතිවුණේ. ජාතියක් ඇති නො වුනා නම්, ජරා මරණයක් නැහැ.

අනාගතම්'පි අද්ධානං ජාති පච්චයා ජරා මරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරා මරණන්ති ඤාණං අනාගතයේත් ජරා මරණ ඇතිවන්නේ ජාතිය නිසා. ජාතියක් නැත්නම් ජරා මරණයක් ඇතිවන්නේ නැහැ. මේ පිළිබඳවත් ඥානයක් ඇතිකර ගන්නට පුළුවන්.

යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං තම්'පි ඛය ධම්මං වය ධම්මං විරාග ධම්මං නිරෝධ ධම්මන්ති ඤාණං යම්කිසි කෙනකුට මේ පිළිබඳව නුවණක් ඇතිවුණා නම්, ඒ නුවණත් තම්පි ඛය ධම්මං - ක්‍ෂය වී යන ධර්මයක්; වය ධම්මං - වැයවී යන ධර්මයක්; විරාග ධම්මං - නො ඇලිය යුතු ධර්මයක්; නිරෝධ ධම්මං - නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුතු ධර්මයක්. (අභිසමය සංයුක්තය)

මෙලෙසින් පටිච්ච සමුප්පාද සෙසු අංගයන් පිළිබඳවත් නුවණක් ඇති කර ගන්නට පුළුවන්. ඒ දැනීම් සෑම එකක්ම සංස්කාර ධර්ම. ඒවා අනිත්‍ය යි. අනිත්‍යයට යන නිසාම නිරුද්ධ වී යනවා. නිරුද්ධ වුනාට පසුව, ඒ සංස්කාර ධර්මවල ''මම, මගේ" කියලා ගන්නට කිසිවක් ඉතිරි වන්නේ නැහැ. එමනිසා ඒවා අනාත්ම ධර්ම. පටිච්ච සමුප්පාද ධර්මයන් මේ ආකාරයෙන් විදර්ශනා ඇසකින් දකින විටත්, ඒ තුළිනුත් කෙනකුට පුළුවන්කම තිබෙනවා නිර්වාණ ධාතුව අවබෝධ කර ගන්නට.

ජරා මරණ නිරෝධය දක නිවනට

ඊළඟට ජරා මරණ නිරෝධය. ජාති නිරෝධා, ජරා මරණ නිරෝධෝ - ජාතිය නිරුද්ධ වීමෙන් ජරා මරණ නිරුද්ධ වනවා. ජාතිය නැත්නම් ජරා මරණයක් නැහැ. ඉපදුණු නිසා තමයි ජරාවත් එන්නේ, මරණයත් එන්නේ. ඉපදීමක් නැත්නම් ජරාවකුත් නැහැ, මරණයකුත් නැහැ.

ජාතිය නිරුද්ධ වෙලා ජරා මරණ නිරුද්ධ වන්නේ යම්කිසි කෙනකු අත්දකින ඒ ඒ මාර්ග ඵල වලට අනුව යි. සෝවාන් වූ කෙනෙක් නැවත උපදින්නේ උපරිම වශයෙන් ආත්ම හතක් පමණ යි. ඒ ආත්ම හතට එහා යම්තාක් ජරා මරණ ඇතිවන්නට තිබෙනවා නම්, ඒ සියල්ල ම සෝවාන් වන විට නිරුද්ධ වී යනවා. ඊට අමතරව සෝවාන් වූ කෙනකු කිසිදා අපායගාමී අකුශල කර්මයක් කරන්නේ නැහැ. එම නිසා සතර අපායෙන් සම්පූර්ණයෙන් ම නිදහස් වෙනවා; ඒ දුගතිගාමී භවයෙනුත් නිදහස් වෙනවා.

එසේ නිදහස් වීමට බලාපොරොත්තු වන කෙනකු විසින් සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස කියන සංයෝජන ධර්ම සම්පූර්ණයෙන් ම නැති කළ යුතු යි. ඒ සඳහා උත්සාහ ගන්නා කෙනකුට තේරෙනවා සක්කාය දිට්ඨිය කියන්නේ මොකක් ද කියලා. පංචස්කන්ධ ධර්මයන් තුළ ආත්මයක් ඇත කියලා ගන්න එකට යි සක්කාය දිට්ඨිය කියන්නේ. මේක ගැන පැහැදිලි අවබෝධයක් ඇතිකර ගන්නවා. සක්කාය දිට්ඨිය ඇතිවන්නේ මොන මොන හේතු නිසා ද, ඇයි මං මේ විදියට මේවා ''මම'' කියලා, ''මගේ'' කියලා, ''මගේ ආත්මයක්'' කියලා ග්‍රාහණය කරන්නේ කියන කරුණුත් ඔහු දකිනවා. එතකොට තේරෙනවා තමන්ගේ මෝඩකම නිසා තමයි මෙම රූපය මම කියලා ගන්නේ, වේදනාව මම කියලා හිතන්නේ, සංඥා - සංස්කාර - විඥාන මම මගේ කියලා ගන්නේ කියලා. මෙතන තනිකරම මෝඩකමක් තිබෙනවා. මේ මෝඩකම දකින්නේ ප්‍රඥාවකින්.

ඒ ප්‍රඥාවෙන් මේ පංචස්කන්ධ ධර්ම අනිත්‍ය වශයෙන් ඔහු දකිනවා, දුක් වශයෙන් දකිනවා, ඒ වගේම අනාත්ම වශයෙනුත්

දකිනවා. නිරන්තරයෙන්ම පංචස්කන්ධ ධර්ම නිරුද්ධ වෙවී නිරුද්ධ වෙවී යන නිසා, මේවා නිරුද්ධ වී යන ධර්ම වශයෙනුත් දකිනවා. යම්කිසි දෙයක් නිරුද්ධ වී ගියාට පසුව, එහි මම හෝ මගේ කියලා, මගේ ආත්මය කියලා ගන්නට කිසි දෙයක් ඉතිරි නො වන නිසා මේවා ඔක්කොම අනාත්ම ධර්මයන් ය කියලත් දකිනවා. ඒ ආකාරයෙන් දැකීම තුළින් ඔහුට මාර්ග ඵල ලබන්නට හැකි වෙනවා. ජරා මරණ නිරෝධය සිදුවන එක් ආකාරයක් ඒ.

ඊට පසුව සකෘදාගාමී වීමට උත්සාහ ගන්නා කෙනකු විසින් ඕළාරික කාමරාග පටිඝ සංයෝජන ධර්මයන් ක්ෂය කළ යුතු වෙනවා. ජරා මරණ ආදී මේ සංසාර දුක ලබා දුන්නේ කාමරාග පටිඝ සංයෝජන වලින් බැඳී සිටිය නිසා බව එවැනි කෙනෙක් අවබෝධ කර ගන්නවා. කාමරාග පටිඝ ඇතිවන්නේ කොයි ආකාරයෙන්ද කියලත් ඔහු දකිනවා. වේදනාස්කන්ධය උපාදාන කිරීම තුළින් ඒ ඇතිවන්නේ. කාමරාග පටිඝ අනුශය නැති කිරීමට කුමක් කළ යුතු ද කියා අවබෝධ කර ගෙන, පංච උපාදාන ස්කන්ධ ධර්මයන්ගේ ඇතිවීම නැතිවීම බල බලා සිටීමෙන් හැර වෙන ක්‍රමයකින් එය නැති කරන්නට බැහැ කියන අවබෝධයේ පිහිටලා කාමරාග පටිඝ ධර්මයන් අඩු කර ගැනීම සඳහා කටයුතු කරන කෙනකුට සකෘදාගාමී වෙන්නට පුළුවන්. එවැනි කෙනෙක් නැවත එක සැරයයි උපදින්නේ. එයින් එහා සියලුම ඉපදීම් නිරුද්ධ වෙලා යනවා. ඒ ඉපදීම් නැති වී යනකොට එක් භවයකට එහා තිබෙන සියලුම ජරා මරණ නිරුද්ධ යි.

අනාගාමී වීමට උත්සාහ කරන තැනැත්තා විසින් කාමරාග පටිඝ ධර්මයන් සම්පූර්ණයෙන් ම නැති කරන්නට ඕනෑ. ඒ සඳහා කාමරාග පටිඝ අනුශයන් ඇතිවීමේ හේතුව දකලා ඒ හේතුව අයින් කරන්නට සිදු වෙනවා. ඒ හේතුව අයින් කිරීම තුළින් කාමරාග පටිඝ අනුශයන් නිරුද්ධ කිරීමෙන් තමයි අනාගාමී තත්ත්වයට පත්වන්නේ. එවැනි කෙනකු උපදින්නේ ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයක පමණයි. අනාගාමී වූ කෙනකුගේ ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයක ඉපදීම හැර අනෙක් ඔක්කොම ජරා මරණ සම්පූර්ණයෙන් ම නිරුද්ධ වී යනවා.

රහත් වනකොට ලෝභ දෝස මෝහ ආදී සියලුම කෙලශ ධර්මයන් සම්පූර්ණයෙන් ම නැති වී යනවා. ඒ වගේම රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා කියන සංයෝජන ධර්මයන් සම්පූර්ණයෙන් ම ක්ෂය වී යනවා. රහත් වූ කෙනකු නැවත කවදාවත් උපදින්නේ නැහැ. ඒ රහත් වූ ජීවිතයට පමණ යි ජරා මරණ තව ඉතිරිවෙලා තිබෙන්නේ. එයින් පසුව කිසි දිනක ජරා මරණයක් එන්නේ නැහැ.

ජරා මරණ නිරෝධය සිදු වන්නේ ඔය ආකාරයෙනු යි. ජරා මරණ නිරෝධය සිදු වෙන ආකාරය ප්‍රායෝගිකව දකින්නට පුළුවන් නම් සෑම මාර්ග ඵලයක්ම ලබන්නට හැකිකම තිබෙනවා.

## ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව වැඩීමෙන් නිවනට

ළඟට ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව. ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව කියන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගුණ ධර්ම දියුණු කර ගැනීමෙන් සියලුම මාර්ග ඵල ලබන්නට පුළුවන් බව මේ අය දන්නවා. සම්මා සතිය, සම්මා සමාධිය, සම්මා දිට්ඨිය වැනි අංගයන් දියුණු කර ගැනීම තුළින් සෝවාන් සකෘදාගාමී අනාගාමී අරහත් කියන ඕනෑම මාර්ග ඵලයක් ලබලා ජරා මරණ නිරුද්ධ කරන්නට පුළුවන් වෙනවා.

මෙන්න මේ විදියට ජරා මරණ ගැන හරි අවබෝධයක් ඇතිවූ කෙනකුට තමාගේ ප්‍රඥාවේ මට්ටමට අනුව සෝවාන් වන්නට පුළුවන්; නැත්නම් සකෘදාගාමී වන්නට, නැත්නම් අනාගාමී වන්නට, නැත්නම් රහත් වන්නට පුළුවන්. ජරා මරණ ගැන අවබෝධයක් ඇතිකර ගත් හැම දෙනාටම මාර්ග ඵල ලබන්නට පුළුවන් කියන එක නො වෙයි මෙයින් අදහස් කරන්නේ. ඒ විදියට නිසි පරිදි කටයුතු කරන කෙනකුට ඒ ආකාරයෙන් උපරිම ප්‍රතිඵලය වුනත් ලබන්නට පුළුවන්.

# ජාතිය-ජාති සමුදය-ජාති නිරෝධය, ජාති නිරෝධ ගාමිණී පටිපදාව දැකීමේ සම්මා දිට්ඨිය

ඊට පසුව භික්ෂු පිරිස විමසනවා ''සියා පනාවුසෝ අඤ්ඤෝපි පරියායෝ යථා අරියසාවකෝ සම්මා දිට්ඨී හෝති, උජුගතාස්ස දිට්ඨී, ධම්මේ අවෙච්චප්පසාදේන සමන්නාගතෝ ආගතෝ ඉමං සද්ධම්මන්ති'' කියලා. සෝවාන් ආදී මාර්ග ඵල ලබලා, ධර්මය ගැන නො සැලෙන ශ්‍රද්ධාවක් ඇති තැනැත්තෙක් බවට පත්වෙලා, සම්මා දිට්ඨිය ඍජු කරගත හැකි වෙනත් ක්‍රමයක් තිබෙනවා ද ස්වාමීන් වහන්ස කියන එකයි, ඒ අසන ලද ප්‍රශ්නයේ සිංහල අදහස.

එයට පිළිතුරු දෙනවා ''සියා ආවුසෝ'' තිබෙනවා ඇවැත්නි. ''යතෝ ඛෝ ආවුසෝ අරියසාවකෝ ජාතිඤ්ච පජානාති, ජාති සමුදයඤ්ච පජානාති, ජාති නිරෝධඤ්ච පජානාති, ජාති නිරෝධ ගාමිණී පටිපදඤ්ච පජානාති, එත්තාවතාපි ඛෝ ආවුසෝ අරියසාවකෝ සම්මා දිට්ඨී හෝති, උජුගතාස්ස දිට්ඨී, ධම්මේ අවෙච්චප්පසාදේන සමන්නාගතෝ ආගතෝ ඉමං සද්ධම්මන්ති''

යම්කිසි කෙනෙක් ජාතිය දකිනවා නම්, ජාති සමුදය දකිනවා නම්, ජාති නිරෝධය දකිනවා නම්, ජාති නිරෝධ ගාමිණී පටිපදාව දකිනවා නම් එතෙකින්ම ඔහුගේ සිත තුළ සම්මා දිට්ඨිය පිහිටියා වෙනවා; ධර්මය අවබෝධ කරගෙන ධර්මය කෙරෙහි නො සැලෙන ශ්‍රද්ධාවක් ඇති පුද්ගලයෙක් බවට පත්වෙලා ලෝකෝත්තර සම්මා දිට්ඨිය අත්දැකපු කෙනෙක් බවට පත්වෙනවා.

මේ දේශනා මාලාවේ දී සැමවිටම වාගේ ලෝකෝත්තර සම්මා දිට්ඨිය උදා කර ගත හැකි වන ආකාරයෙනු යි අප මේ දේශනා ඉදිරිපත් කරන්නේ. මෙම සූත්‍රයේත් සෑම කරුණක් ම ලෝකෝත්තර සම්මා දිට්ඨියට යොමු කරමිනු යි ඉදිරිපත් කර ඇත්තේ.

මීට පසුව සැරියුත් ස්වාමීන් වහන්සේ වදාරනවා, ''යතෝ ඛෝ ආවුසෝ ඒවං ජාතිං පජානාති, ඒවං ජාති සමුදයං පජානාති,

ඒවං ජාති නිරෝධං පජානාති, ඒවං ජාති නිරෝධගාමිණී පටිපදං පජානාති, සෝ සබ්බසෝ රාගානුසයං පහාය, පටිඝානුසයං පටිවිනෝදෙත්වා, අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා, අවිජ්ජං පහාය, විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරෝ හෝති''

මේ ආකාරයෙන් යම්කිසි ආර්ය ශ්‍රාවකයෙක් ජාතිය හරියට දකිනවා නම්, ජාති සමුදය - ජාතිය ඇතිවීමේ හේතුව හරියට අවබෝධ කර ගන්නවා නම්, ජාති නිරෝධය සිදු වන්නේ මෙහෙම යි කියලා හරියට දකිනවා නම්, ජාති නිරෝධ ගාමිණී පටිපදාව - ජාතිය නැති කරන ප්‍රතිපත්තිය මේක යි කියලා හරියට අවබෝධ කර ගන්නවා නම්, ඔහු

සබ්බසෝ රාගානුසයං පහාය - රාග අනුශය සම්පූර්ණයෙන් ම නැති කරලා,

පටිඝානුසයං පටිවිනෝදෙත්වා - පටිඝ අනුශය සම්පූර්ණයෙන් ම නැත්තටම නැති කරලා,

අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා - 'මම' කියලා කෙනෙක් සිටිනවා කියන අස්මිමානය සහ දිට්ඨි මාන අනුශය ධර්මයන් සම්පූර්ණයෙන් ම නැති කරලා,

අවිජ්ජං පහාය - අවිද්‍යාව දුරු කරලා,

විජ්ජං උප්පාදෙත්වා - විද්‍යාව උපදවා ගෙන,

දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරෝ හෝති - මේ ජීවිතයේ දීම දුක සම්පූර්ණයෙන් ම කෙළවර කරනවා.

එතකොට ඔය කරුණු හතර අවබෝධ කර ගැනීමෙනුත් පාරමී ශක්තියක් ඇති, සති-සමාධි-ප්‍රඥා දියුණු වී සිටින කෙනකුට රහත් ඵලය දක්වාම ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්. හැමෝටම නො වෙයි. සති - සමාධි - ප්‍රඥා දියුණු කරලා නැතිනම්, ඒ ඒ මාර්ග ඵල ලැබීමට සුදුසු මට්ටමට සති සමාධි ප්‍රඥා ආදී ධර්මයන් දියුණු වෙලා නැත්නම්, මේවා දිය කරලා පෙව්වත්, ඒ කරුණු කොච්චර අවබෝධ වුනත් නිවන් ලබන්නට බැහැ.

''කතමා පනාවුසෝ ජාති, කතමෝ ජාති සමුදයෝ, කතමෝ ජාති නිරෝධෝ, කතමා ජාති නිරෝධ ගාමිණී පටිපදා?'' ඊළඟට

විමසනවා, මේ ජාතිය කියන්නේ කුමක් ද, මොකක් ද ජාති සමුදය කියන්නේ, ජාතිය නිරෝධය කියන්නේ කුමක් ද, ජාති නිරෝධ ගාමිණී පටිපදාව කියන්නේ කුමකට ද?

**''යා තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායේ ජාති, සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවෝ, ආයතනානං පටිලාභෝ - අයං වුච්චතාවුසෝ ජාති.''**

ජාති - ජාතිය කියන්නේ ඇවැත්නි මෙන්න මේක යි. යම්කිසි තැනක, මනුෂ්‍ය-අමනුෂ්‍ය-තිරිසන්-දිව්‍ය-බ්‍රහ්ම වැනි ආත්මභාවයක ජාතියේ පහළවීමක් තිබෙනවා නම්,

සඤ්ජාති - සියලුම ඉන්ද්‍රියයන් සහිතව මනාසේ ඉපදීමක් තිබෙනවා නම් (මනුෂ්‍ය ලෝකයේ ඉපදෙනකොට මවු කුසයේ පිළිසිඳ ගන්නා අවස්ථාවේ ඔක්කොම ඉන්ද්‍රියයන් නැහැ; ඒවා පසුව යි වැඩෙන්නේ. අමනුෂ්‍ය ආත්ම වැනි තැන්වල උපදිනකොට සියලුම ඉන්ද්‍රිය ධර්මයන් සම්පූර්ණවෙල යි තිබෙන්නේ. ඒකයි සඤ්ජාති කියන්නේ.),

ඔක්කන්ති - මවුකුස වලට බැස ගැනීමක් තිබෙනවා නම් (මනුෂ්‍ය, සිවුපාසතුන් වැනි),

අභිනිබ්බත්ති - සම්පූර්ණයෙන් ම ඕපපාතික වශයෙන් පහළවීමක් තිබෙනවා නම් (දෙවියන්, බ්‍රහ්මයන් වැනි),

ඛන්ධානං පාතුභාවෝ - රූප වේදනා සංඥා සංස්කාර විඥාන කියන ස්කන්ධ ධර්මයන්ගේ පහළවීමක් තිබෙනවා නම්,

ආයතනානං පටිලාභෝ - චක්ඛායතන සෝතායතන ඝානායතන ජිව්හායතන කායායතන මනායතන කියන ආයතන ධර්මයන්ගේ ප්‍රතිලාභයක් තිබෙනවා නම් ඒකට තමයි ඇවැත්නි ජාතිය කියන්නේ.

භව සමුදයා, ජාති සමුදයෝ - ජාති සමුදය - ජාතිය ඇතිවීමේ හේතුව තමයි භව.

භව නිරෝධා, ජාති නිරෝධෝ - භවය නිරුද්ධ වීමෙන් තමයි ජාතිය නිරුද්ධ වී යන්නේ.

අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ ජාති නිරෝධ ගාමිණී පටිපදා - ජාතිය නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාව මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ම යි. **සෙය්‍යථීදං - සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්පෝ, සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ, සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි.** ඔය කියපු අංග අටයි ජාති නිරෝධ ගාමිණී පටිපදාව.

## ජාති - සතර යෝනි

නැවත නැවත පුනර්භවය ගෙනදෙන එකට තමයි ජාතිය කියන්නේ. පුනර්භවය ගෙනදෙන ආකාර අනුව ඒවා කොටස් 4 කට බුදුරජාණන් වහන්සේ බෙදලා පෙන්නුම් කරලා තිබෙනවා, අණ්ඩජ-ජලාබුජ-සංසේදජ-ඕපපාතික කියලා.

**අණ්ඩජ** - කියන්නේ බිජුවට බිඳගෙන උපදින කුරුල්ලන් වැනි සත්ත්වයන්ට. මෙය හඳුන්වන්නේ අණ්ඩජයෝනිය නමින්.

**ජලාබුජ** - කියන්නේ මව්කුසක් ඇසුරු කර ගෙන උපදින මනුෂ්‍යයන්, සිවුපා වැනි සත්වයන්ට. වස්තුකෝෂයක් බිඳගෙන උපදින නිසා මෙය හඳුන්වන්නේ ජලාබුජයෝනිය නමින්.

**සංසේදජ** - කියන්නේ කුණුවූ මස් මාළු ආදී දුගඳ හමන තැන්වල බෝවෙන පණුවන් වැනි සත්ත්වයන්ට. සංසේදජ යෝනිය කියලයි මෙයට කියන්නේ.

**ඕපපාතික** - දෙවියන්, නේරයික සත්ත්වයන්, අමනුෂ්‍යයන් වැනි එකවරම පහළවන සත්ත්වයන් අයත්වන්නේ ඕපපාතික යෝනියට.

මේ කොටස් හතරම ආවරණය වන පරිදි තමයි ජාතිය අර්ථ නිරූපණය කොට බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ වදාළ පාඨ ඒ ආකාරයෙන්ම සැරියුත් හාමුදුරුවෝ මේ ප්‍රකාශ කරන්නේ. එදා සැරියුත් ස්වාමීන් වහන්සේ

ඔය පාඨ කියලා, උන්වහන්සේගේ අවබෝධය සහ ප්‍රායෝගික අත්දැකීම් පාදක කරගෙන, එම ධර්ම කරුණු, විශේෂයෙන්ම මෙම කරුණු දැනගැනීම තුළින් නිවන් අවබෝධ කර ගත හැක්කේ කෙසේ ද වැනි කරුණු විස්තර කරන්නට ඇති. ඒවා කිසිතැනක පොත්පත්වල ලියැවිලා නැහැ. ලියන්නට හැකි කමකුත් නැහැ. එහෙම ලිව්වා නම් ත්‍රිපිටකය පොත් ලක්‍ෂ-කෝටි ගණනකටත් වැඩි විශාල ප්‍රමාණයකින් යුතු එකක් වනවා. පොත්වල දක්නට ලැබෙන්නේ බොහෝවිට මාතෘකාවට තැබූ පාඨ පමණ යි. අපගේ ධර්ම දේශනාවල දීත් බුදුරජාණන් වහන්සේ වදාළ මාතෘකා පාඨ අපේ අවබෝධයන් මත, අපගේ ප්‍රායෝගික අත්දැකීම් පාදක කරගෙන, අපට වැටහෙන ආකාරයෙන් තමයි ඉදිරිපත් කරන්නේ.

## ජාති සමුදය

**භව සමුදයා ජාති සමුදයෝ** - භවය නිසයි ජාතිය ඇතිවන්නේ. 'භව' කියන වචනයේ අර්ථ දෙකක් තිබෙන බව පොත්වල දක්වා තිබෙනවා උප්පත්ති භව සහ කර්ම භව කියලා.

උප්පත්ති භව කියන්නේ සත්ත්වයන් උපදින ලෝක වලට. භවය කියන වචනය ලෝකයටත් පාවිච්චි කරනවා. මේවා ප්‍රධාන වශයෙන් කොටස් 3 කට බෙදන්න පුළුවන්,

1. කාම භව, රූප භව, අරූප භව
2. ඒකවෝකාර භව, චතුවෝකාර භව, පංචවෝකාර භව
3. සඤ්ඤී භව, අසඤ්ඤී භව, නේවසඤ්ඤීනාසඤ්ඤී භව

කියලා.

**කාම භව** කාම ලෝක 11 ක් තිබෙනවා. ඒ කාමාවචර ලෝක වලට තමයි කාම භව කියන්නේ.

1. දිව්‍ය ලෝක 6 යි (චාතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මාණරතිය, පරනිම්මිතවසවත්තිය),
2. මනුෂ්‍ය ලෝකය යි,
3. සතර අපාය යි (තිරිසන්, ප්‍රේත, අසුර නිකාය සහ නිරය) එකතු වූ විට සුගතිගාමී 7 ක් සහ දුගතිගාමී 4 ක් වශයෙන් 11ක් වනවා.

මෙම කාමාවචර ලෝක "**කාම ධාතු**" කියාත් හඳුන්වනවා. ඒ වගේම ඒවාට "**හීන ධාතු**" කියලත් කියනවා.

**රූප භව** කියන්නේ රූපාවචර බ්‍රහ්ම ලෝක 16 ක් තිබෙනවා, ඒ 16 ට. "**රූප ධාතු**", "**මජ්ඣිම ධාතු**" කියන්නෙත් මේවාට.

1. බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහාබ්‍රහ්ම කියලා බ්‍රහ්ම ලෝක 3 ක් තිබෙනවා. පහළම තිබෙන මේ ලෝක 3 එකම තලයක යි පිහිටා තිබෙන්නේ.
2. පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර කියලා ඊට උඩින් තව බ්‍රහ්ම ලෝක 3 ක් තිබෙනවා. ඒ ලෝක 3 ත් පිහිටලා තිබෙන්නේ එකම තලයක.
3. ඊට ඉහළින් පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණක කියලා තවත් එක් තලයක පිහිටි බ්‍රහ්ම ලෝක 3 ක් තිබෙනවා.
4. ඊටත් ඉහළින් වේහප්ඵල, අසඤ්ඤසත්ත කියලා තවත් බ්‍රහ්ම ලෝක 2 ක් තිබෙනවා. මේ ලෝක 2 පිහිටා තිබෙන්නෙත් එකම තලයක.
5. ඊට උඩින් ශුද්ධාවාස බ්‍රහ්ම ලෝක 5 එකිනෙකට ඉහළින් පිහිටලා තිබෙනවා. අනාගාමී අය පමණක් උපදින බැවිනු යි අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිට්ඨ කියන ඒ බ්‍රහ්ම ලෝක 5 ට ශුද්ධාවාස කියලා කියන්නේ.

**අරූප භව** කියන්නේ කය නැති සිත විතරක් තිබෙන ලෝක වලට. අරූපාවචර ධ්‍යාන නැති කිසි කෙනකුට ඒවායේ උපදින්නට බැහැ. "**අරූප ධාතු**", "**ප්‍රණීත ධාතු**" කියලත් මේවට කියනවා.

පළමුවන අරූපාවචර ලෝකය ආකාසානඤ්චායතනය
දෙවන අරූපාවචර ලෝකය විඤ්ඤාණඤ්චායතනය
තෙවන අරූපාවචර ලෝකය ආකිඤ්චඤ්ඤායතනය
හතරවෙනි එක නේවසඤ්ඤානාසඤ්ඤායතනය

මේ විධියට කාම භව 11 යි, රූප භව 16 යි, අරූප භව 4 යි එකතු වුණාම ඔක්කොම ලෝක 31 ක් වනවා.

මේ ලෝක 31 ම යි ඒකවෝකාර භව ආදී වශයෙන් හෝ, සඤ්ඤී භව ආදී වශයෙන් දක්වන්නෙත්.

**ඒකවෝකාර භව:** රූප වේදනා සංඥා සංස්කාර විඥාන කියලා ස්කන්ධ 5 **ක්** තිබෙනවා. මෙම ස්කන්ධ අතුරෙන් එක් ස්කන්ධයක් පමණක් ඇති ලෝකයට යි ඒකවෝකාර භව කියන්නේ. රූපාවචර බ්‍රහ්ම ලෝකයක් වන අසඤ්ඤසත්තයේ තිබෙන්නේ රූපස්කන්ධය පමණ යි. වේදනා සංඥා සංස්කාර විඥාන කියන නාමස්කන්ධ 4 එහි නැහැ. එක් ස්කන්ධයක් පමණක් පවතින නිසා අසඤ්ඤසත්තයට ඒකවෝකාර භව කියලා කියනවා.

**චතුවෝකාර භව:** ස්කන්ධ 4 ක් පවතින ලෝක කියන එකයි චතුවෝකාර භව කියන එකේ අර්ථය. අරූපාවචර ලෝකවල රූපස්කන්ධය නැහැ. වේදනා - සංඥා - සංස්කාර විඥාන කියන නාමස්කන්ධ 4 පමණ යි ඒ ලෝකවල පවතින්නේ. ඒක නිසා අරූපාවචර බ්‍රහ්ම ලෝක 4 චතුවෝකාර භව වශයෙන් හඳුන්වනවා.

**පංචවෝකාර භව:** ස්කන්ධ පහම පවතින අනෙක් ලෝක පංචවෝකාර භව නමින් හඳුන්වනවා. අසඤ්ඤසත්තයත්, අරූපාවචර ලෝක 4 ක් හැර ඉතිරි ලෝක 26 යේම රූප වේදනා සංඥා සංස්කාර විඥාන කියන ස්කන්ධ පහම පවතිනවා. කාමාවචර ලෝක 11 යි අසඤ්ඤතලය හැර ඉතිරි රූපාවචර බ්‍රහ්ම ලෝක 15 යි එකතු වුණාම යි 26 ක් වන්නේ.

මේ ලෝක 31 ම තවත් ආකාරයකින් බෙදා දක්වන්නට පුළුවන්, සඤ්ඤී භව, අසඤ්ඤී භව සහ නේවසඤ්ඤීනාසඤ්ඤී භව කියලා.

**අසඤ්ඤී භව:** සංඥාවක් කොහෙත්ම නැති ලෝකයට යි අසඤ්ඤී භව කියන්නේ. අසඤ්ඤසත්තයේ රූපය විතරයි තිබෙන්නේ.

සිත නැහැ. එම නිසා කිසිම දැනීමක් නැහැ. කිසිම දැනීමක් නැති නිසයි අසඤ්ඤසත්තය 'අසඤ්ඤී භව'' නමින් හඳුන්වන්නේ.

**නේවසඤ්ඤීනාසඤ්ඤී භවඃ** සංඥාවක් තිබෙනවා ද නැත් ද කියලා කියන්නටවත් බැරි තරම් සියුම් වූ දැනීමක් පමණක් පවත්නා බැවිනු යි නේවසඤ්ඤානාසඤ්ඤායතන අරූප ලෝකය ''නේවසඤ්ඤීනාසඤ්ඤී භව'' නමින් හඳුන්වන්නේ.

**සඤ්ඤී භවඃ** අසඤ්ඤසත්තයත්, නේවසඤ්ඤානාසඤ්යතනයත් හැර ඉතිරි ලෝක 29 යේම සංඥාවන් ඇති නිසා ඒ ලෝක 29 ''සඤ්ඤී භව'' නමින් හඳුන්වනවා.

මෙන්න මේ ආකාරයෙන් තමයි උප්පත්ති භව කියන එක පොත්වල විස්තර කර තිබෙන්නේ.

## කම් භව

කර්ම භව කියන්නේ කුශලාකුශල කර්ම වලට. මෙම කර්ම සංස්කාර ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා තිබෙනවා.

1. පුඤ්ඤාභිසඞ්ඛාර - කුශල්
2. අපුඤ්ඤාභිසඞ්ඛාර - අකුශල්
3. ආනෙඤ්ජාභිසඞ්ඛාර - ධ්‍යාන කුශල් සිත්.

රැස්කරන නිසයි 'අභිසඞ්ඛාර' කියා දක්වෙන්නේ. කුශල් රැස්කිරීමක් තිබෙනවා, අකුශල් රැස් කිරීමක් තිබෙනවා. 'ආනෙඤ්ජ' කියන්නේ නො සැලෙන කියන එකයි. ධ්‍යාන සිත් නො සැලෙමින් දිගටම පවත්නා ලෙසින් පෙනෙන නිසයි, ධ්‍යාන සිත් වලට ආනෙඤ්ජාභිසඞ්ඛාර කියා කියන්නේ.

නැවත ඉපදීම සිදු වන ආකාරය කියන්නටයි මම මේ පසුබිම සකසන්නේ.

බුදුරජාණන් වහන්සේගෙන් දවසක් ආනන්ද හාමුදුරුවෝ විමසනවා මෙහෙම ප්‍රශ්නයක්.

**''භවෝ, භවෝ'ති භන්තේ වුච්චති. කිත්තාවතා නු බෝ භන්තේ භවෝ හෝතී ති?''**

භවය භවය කියලා ප්‍රකාශ කරනවා, කෙතෙකින් නම් බුදුරජාණන් වහන්ස, භවය වෙනව ද?

මෙන්න මේකට පිළිතුරක් වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනවා. **''කාමධාතුවේපක්කඤ්ච ආනන්ද කම්මං නාභවිස්ස, අපි නු බො කාමභවෝ පඤ්ඤායේථ?''** කාම ලෝකයේ, ඒ කියන්නේ දිව්‍ය ලෝක භයෙයි, මනුෂ්‍ය ලෝකයෙයි, සතර අපායෙයි, විපාක දීමට තරම් ශක්තියක් ඇති කර්‍මයක් නො තිබුණා නම්, කාම භවයක් පණවන්නට පුළුවන් ද ආනන්ද?

**''නො හේතං භන්තේ''** බැහැ, ස්වාමීන් වහන්ස කියලා ආනන්ද හාමුදුරුවෝ පිළිතුරු දුන්නා.

අපි ඔක්කොම සිටින්නේ මනුෂ්‍ය ලෝකයේ. මනුෂ්‍ය ලෝකය කාමාවචර ලෝකයට යි අයත් වන්නේ. මේ කාමාවචර ලෝකයේ ඉපදීමට හේතු වූ කුශල කර්‍මයක් ගිය භවයේ මැරෙන අවස්ථාවේ දී අපට සිහිපත් වුණා. ඒක නිසා තමයි අපි මේ මනුෂ්‍යයන් වශයෙන් ඉපදුනේ. ගිය ආත්මයේ මැරෙන වේලාවේ අපට අකුශල කර්‍මයක් සිහිපත් වුනා නම් අප උපදින්නේ කාමවචර ලෝකයේ දුගතියක යි. එතකොට කාම භවයක්, කාම ලෝකයක් පණවන්නට නම්, කාම ලෝකයේ විපාක දෙන කර්‍ම ශක්තියක් තිබෙන්නට ඕනෑ. එවැනි කර්‍ම ශක්තියක් නැතිනම් කාම ලෝකයේ උපදින්නට බැහැ.

**''ඉති බෝ ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනේහෝ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයෝජනානං හීනාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. ඒවං ආයතිං පුනබ්භවා නිබ්බත්ති හෝති.''** මෙලෙසින් බුදුහාමුදුරුවෝ ඊළඟට ප්‍රකාශ කළා. මේ විධියට ආනන්ද, කර්‍මය තමයි ක්ෂේත්‍රය වන්නේ; කුඹුර වන්නේ- **කම්මං ඛෙත්තං.**

කුඹුරක අපි වී වැනි බීජයක් වපුරනවා වගේ විඥානය තමයි බීජය - '**විඤ්ඤාණං බීජං.**'

බීජයක් වැපුරුවාට පස්සේ ඒක වැඩෙන්නට වතුර ඕනෑ, තෙතමනයක් තිබෙන්නට ඕනෑ - **''තණ්හා ස්නේහෝ''**, තණ්හාව තමයි තෙතමනය.

**අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං** අවිද්‍යාවෙන් වැසී ගිය මේ සත්ත්වයන්ගේ, ඒ වගේම තණ්හාවෙන් බැඳුණු සත්ත්වයන්ගේ විඥානය '**හීනාය ධාතුයා පතිට්ඨිතං**' හීන ධාතුවක් වශයෙන් හැඳින්වෙන මේ කාම ලෝකයේ පිහිටනවා.

එතකොට අවිද්‍යාව තිබෙනතාක් කල්, කාමාවචර කුශලාකුශල කර්ම තිබෙනතාක් කල්, තණ්හාව තිබෙනතාක් කල්, ඒ කාමවචර කර්මයක් මරණ මොහොත් සිහිපත් වුණොත් එහෙම නියත වශයෙන්ම කෙනකුට කාමාවචර ලෝකයේ උපදින්නට සිදු වෙනවා; දිව්‍ය ලෝකයක හරි, මනුෂය ලෝකයේ හරි, සතර අපායේ හරි උපදිනවා. ''**ඒවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හෝති**'' මෙලෙසින් කාම භවයේ නැවත පුනර්භවය ගෙන දෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා, ''**රූපධාතුවේපක්කඤ්ච ආනන්ද කම්මං නාභවිස්ස, අපි නු ඛෝ රූපභවෝ පඤ්ඤායේථ?**'' රූප භවයෙහි විපාක දෙන කර්මයක් නො තිබුණා නම් ආනන්ද, රූප භවයක් පණවන්නට පුළුවන් ද?

රූපාවචර බ්‍රහ්ම ලෝකයක උපදින්නට නම් අනිවාර්යයෙන් ම රූපාවචර ධ්‍යාන සිත් උපදවා ගෙන තිබෙන්නට ඕනෑ. රූපාවචර ධ්‍යාන සිත් උපදවා ගෙන නැති කෙනකුට ආනන්ද, පුළුවන් ද රූප ලෝකයක උපදින්නට?

''**නො හේතං භන්තේ**'' ඒක සිදුවන්නේ නැහැ ස්වාමීන් වහන්ස.

''**ඉති ඛෝ ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනේහෝ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං මජ්ඣිමාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. ඒවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හෝති**'' මෙන්න මෙලෙසින් ආනන්ද, කර්මය යි ක්ෂේත්‍රය, විඥානය යි බීජය, තණ්හාව යි තෙතමනය, අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු සත්ත්වයන්ගේ විඥානය මජ්ඣිම ධාතු වශයෙන් සැළකෙන රූප භවයෙහි පිහිටනවා.

ධ්‍යාන සිත් උපදවා ගත් රහත් නොවූ අයගේ සිත් තුළත් අවිද්‍යාව තිබෙනවා, භවයේ රැඳී සිටීමේ ආශාව ආදී තණ්හාවත් තිබෙනවා, සංයෝජන වලිනුත් බැඳිල යි සිටින්නේ. මේ නිසා ඒ

අය රූපාවචර බ්‍රහ්ම ලෝකවල උපදිනවා. ''ඒවං ආයතිං **පුනබ්භවාභිනිබ්බත්ති හෝති''** - රූපාවචර බ්‍රහ්ම ලෝකයේ පුනර්භවය ගෙන දෙන්නේ ඔන්න ඔය ආකාරයට යි ආනන්ද.

ඊළඟට විමසනවා බුදුරජාණන් වහන්සේ **''අරූපධාතු වේපක්කඤ්ච ආනන්ද කම්මං නාභවිස්ස, අපි නු ඛෝ අරූපභවෝ පඤ්ඤායේථ?''**

අරූපාවචර ධ්‍යාන සිත් කෙනෙක් උපදවා ගෙන නැත්නම් ආනන්ද, එවැනි කෙනකුට පුළුවන් ද අරූපාවචර ලෝකයක ඉපදෙන්නට?

'**නෝ හේතං භන්තේ**' ඒක සිදුවන්නට බැහැ, ස්වාමීන් වහන්ස.

**''ඉති ඛෝ ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනේහෝ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං පණීතාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. ඒවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හෝති.**

**ඒවං ඛො ආනන්ද, භවෝ හෝතී'ති.''**

මෙලෙසින් ආනන්ද, කර්මය යි ක්ෂේත්‍රය, විඥානය යි බීජය, තණ්හාව යි ස්නේහය, අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු සත්ත්වයන්ගේ විඥානය ප්‍රණීත ධාතුව වශයෙන් සැළකෙන අරූපාවචර ලෝකයක පිහිටනවා. මෙලෙසිනු යි ආනන්ද, අරූපාවචර ලෝකයක පුනර්භවය ගෙන දෙන්නේ.

මෙලෙසිනු යි ආනන්ද, භවය පැණවෙන්නේ.

රහත් නොවූ, අරූපාවචර ධ්‍යාන සිත් උපදවා ගත් කෙනකුගේ සිත තුළත් අවිද්‍යාව තිබෙන නිසා, තණ්හා ආදී සංයෝජන ධර්මයන් තිබෙන නිසා, ප්‍රතිසන්ධි විඥානය අරූපාවචර ලෝකයක පහළවනවා. මෙන්න මේ විධියට තමයි ප්‍රණීත ධාතුව වශයෙන් හැඳින්වෙන අරූපාවචර ලෝකයක ගිහිල්ලා උපදින්නේ.

මෙන්න මේ විධියට මැරෙන මොහොතේ කර්මයක් සිහිපත්වීම නිසා තමයි කෙනෙක් මැරුණට පස්සේ නැවත උපදින්නේ. කුශල කර්මයක් සිහිපත් වුනොත් සුගතියක උපදියි; අකුශල කර්මයක් සිහිපත් වුනොත් දුගතියක උපදියි.

## කර්ම නියාමය

ලෝකයේ තිබෙනවා නියාම ධර්ම 5 ක්, ඍතු නියාමය - බීජ නියාමය - කර්ම නියාමය - ධම්ම නියාමය සහ චිත්ත නියාමය කියලා. නියාම කියන්නේ ඒ ආකාරයෙන්ම සිදුවන, වෙනත් ආකාරයකින් බොහෝවිට සිදු නො වන දේවල්වලට.

ශීත-උෂ්ණ වැනි ඍතු තත්ත්වයන් මත ස්වභාවික ලෙස සිදු වන දේවලු යි ඍතු නියාම නමින් හඳුන්වන්නේ. කාලගුණික විපර්යාස, අව්ව, වැස්ස, සුළං, පස්-පොහොර-ජලය-වාතය ආදිය නිසා ගස් වැල් ආදිය වැඩෙන ආකාරය, ඒ ඒ ඍතු කාලයන්ට අනුව සිදු වන වෙනස්කම් ආදිය මෙයට ඇතුළත් වෙනවා.

බීජ නියාම කියන්නේ ඒ ඒ බීජ වලට අනුව නිපදවෙන ස්වභාවික දේවල් වලට. උදාහරණ වශයෙන් උක් ගස් පැණි රස වීම, කොහොඹ කොළ තිත්ත රස වීම, ඒ ඒ පළතුරු වලට ම ආවේණික වූ ඒ ඒ රස ගුණ ආදිය, අඹ ඇටයකින් අඹ ගසක්ම පැළවීම වැනි ඒ ඒ බීජයන්ගෙන් ඒ ඒ ගස්ම පැළවීම ආදිය බීජ නියාමයට අනුව යි සිදුවන්නේ.

ධම්ම නියාමය කියා හැඳින්වෙන්නේ නියාම ධර්මානුකූලව සිදුවන සියලුම දේවල් වලට. උදාහරණ වශයෙන් කියනවා නම්, බෝධිසත්වයන් බුද්ධත්වයට පත්වීම, බුදුරදුන් දම්සක් දෙසීම, ආයු සංස්කාර හැරීම, පිරිනිවන් පෑම වැනි අවස්ථාවල දී 10000ක් සක්වළ කම්පිත වීම ධම්ම නියාමයක්. සියලු සංස්කාර ඒ ඒ හේතුන්ට අනුව ඇතිවීම, අනිත්‍යයට යාම, නිරුද්ධ වී යාම ධම්ම නියාමයක්. මේ ආදී ස්වභාව ධර්මානුකූලව සිදුවන සියල්ලම ධම්ම නියාමයට යි ඇතුළත් වන්නේ.

සිතේ ක්‍රියාදාමයන් සිදුවන ආකාරයට යි, චිත්ත නියාමය කියන්නේ. සිත ඇතිවීමේ හේතු ඇතිවූ විට සිත පහළවීම, හේතු නිරුද්ධ වී යාමෙන් සිත නිරුද්ධ වී යාම, සිතේ විවිධ චිත්ත සංස්කාර ධර්මයන් ක්‍රියාත්මක වීම ආදිය චිත්ත නියාමයට අනුව යි සිදු වන්නේ.

කර්ම නියාමය කියන්නේ, හොඳ කර්මයන්ට අනුව හොඳ විපාක ලැබීම, නරක කර්මයන්ට අනුව නරක විපාක ලැබීම, කුශලාකුශල කර්ම විපාක ඵල දීම සිදුවන අයුරු ආදී සියල්ලටම යි.

මරණ මොහොතේ කර්ම ඉදිරිපත් වන්නේ මෙන්න මේ කර්ම නියාමයට අනුකූලව බව පොත්වල දැක්වෙනවා. ඒ අනුව මරණ මොහොතේ පළමුවෙන්ම එන්නේ ගරුක කර්මයක් තිබුණොත් ඒක. ගරුක කර්මයක් නො තිබුණොත් එන්නේ ආසන්න කර්මයක්. ආසන්න කර්මයකුත් නැති විට ආචිණ්ණ කර්මයක් එනවා. ආචිණ්ණ කර්මයකුත් නැත්නම් කටත්තා කර්මයක් එනවා.

**ගරුක කර්ම**

ගරුක කර්ම කියන්නේ බරපතල කර්ම වලට. අකුශල පැත්තේ තිබෙන ගරුක කර්ම වශයෙන් දැක්වෙන්නේ පංචානන්තරිය පාප කර්ම වලට. මව මැරීම-පියා මැරීම-රහත් වූ කෙනකු මැරීම - බුදුරදුන්ගේ ඇඟේ ලේ සෙලවීම-සංඝභේද කිරීම කියන ඒ කර්ම යම්කිසි කෙනකු කරලා තිබෙනවා නම්, අනිවාර්යයෙන් ම ඒ කර්ම යි මරණ මොහොතේ සිහියට එන්නේ. ඊළඟ භවයේ එවැනි අය නියත වශයෙන් ම අපායේ උපදිනවා. කිසිම කෙනකුට ඒක වළක්වන්නට බැහැ. මේ බරපතල පාපකර්ම පහෙන් සංඝභේද කර්මය කරන්නට පුළුවන් වන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේලාට පමණ යි. ධර්මය අධර්මය වශයෙන් දක්වමින්, විනය අවිනය වශයෙන් දක්වමින්, ඇවත් ඇවත් නො වේ යැයි දක්වමින්, බුදුරදුන් විසින් දේශිත ධර්මය 'තථාගතභාසිත'' නො වේ යැයි ආදී කරුණු දක්වමින්, සංඝයා භේද කොට, වෙන් වෙන්ව පෝය කර්ම - විනය කර්ම ආදිය සිදු කළ විට යි සංඝභේද පාප කර්මය සිදු වන්නේ.

මාර්ග-ඵල ලාභී ආර්යයන්ට උපවාද කොට එයට ක්ෂමාව නො ගෙන සිටියොත්, එවැනි අයත් ඊළඟ භවයේ උපදින්නේ දුගතියක යි.

කුශල පැත්තේ ගරුක කර්ම කියන්නේ ප්‍රධාන වශයෙන් රූපාවචර හෝ අරූපාවචර ධ්‍යාන කුශල සිත් වලට. මීට කලින් රූප භව, අරූප භව විස්තර කරන විට මා කීවා බ්‍රහ්මලෝකවල උපදින්නට නම් අනිවාර්යයෙන් ම ධ්‍යාන සිත් තිබිය යුතු බව.

යම්කිසි කෙනෙක් රූපාවචර ධ්‍යාන සිත් උපදවා ගෙන

සිටිනවා නම්, ඒ වගේම ඒ ධ්‍යාන සිත් පිරිහෙන්නේ නැතිව මරණ මොහොත දක්වාම දිගටම පවත්වාගෙන යන්නට පුළුවන්කම තිබුණොත්, මරණ මොහොතේ ගරුක කර්මයක් වශයෙන් ඉදිරියට එන්නේ ඒ රූපාවචර ධ්‍යාන සිත් තමයි. ඒ ඒ රූපාවචර ධ්‍යාන සිත්වලට අනුව යි, ඒ ඒ බ්‍රහ්ම ලෝකවල උපදින්නේ. රූපාවචර ධ්‍යාන සිත් 4 ක් තිබෙනවා පළමුවන - දෙවන - තුන්වන - සතරවන ධ්‍යාන සිත් කියලා.

පළමුවන ධ්‍යාන සිත වඩන්නට පුළුවන් තුන් ආකාරයකට. කෙනකුට පුළුවන් ඒ ධ්‍යාන සිත නිතර නිතර භාවිතා කරලා, නැවත නැවත බහුලීකරණය කරලා, ඉතා හොඳින් වශීකෘත කරලා, එම ධ්‍යාන සිත ඉතා උත්කෘෂ්ට අන්දමින් වඩන්නට. තවත් කෙනකුට එය වඩන්නට පුළුවන් එතරම්ම උත්කෘෂ්ට ප්‍රමාණයෙන් නොව මධ්‍යම ප්‍රමාණයෙන්. තවත් කෙනකුට මධ්‍යම ප්‍රමාණයෙනුත් නො වෙයි, ඊටත් අඩු ප්‍රමාණයෙන් එම ධ්‍යාන සිත වඩන්නට පුළුවන්.

ඉතාම අඩු ප්‍රමාණයෙන් පළමුවන ධ්‍යාන සිත වඩා ඇති නමුත් ඒ ධ්‍යාන සිත මැනවින් ප්‍රගුණ කරලා, භාවිතා කරලා, බහුලීකරණය කරලා, වශීකෘත කරලා නැති නම්, එවැනි අයකු උපදින්නේ පහළම බ්‍රහ්ම ලෝකයේ - බ්‍රහ්මපාරිසජ්ජ ලෝකයේ.

පළමු ධ්‍යාන සිත මධ්‍යම ප්‍රමාණයෙන් වැඩූ කෙනකු උපදින්නේ බ්‍රහ්මපුරෝහිත කියන දෙවන බ්‍රහ්ම ලෝකයේ.

එම ධ්‍යාන සිත ඉතා උත්කෘෂ්ට අන්දමින් වැඩූ කෙනකු උපදින්නේ තුන්වෙනි බ්‍රහ්ම ලෝකයේ - මහා බ්‍රහ්ම ලෝකයේ.

(මේ බ්‍රහ්ම ලෝක 3 ම එකම තලයක යි පිහිටා තිබෙන්නේ.)

දෙවන ධ්‍යාන සිතත් මේ වගේම තුන් ආකාරයකින් වඩන්නට පුළුවන්. ඉතාම අඩු වශයෙන් දෙවන ධ්‍යාන සිත වැඩූ අය උපදින්නේ ඊළඟට තිබෙන බ්‍රහ්ම ලෝක තුනේ පළමුවන බ්‍රහ්ම ලෝකය වන පරිත්තාභ බ්‍රහ්ම ලෝකයේ.

මධ්‍යම ප්‍රමාණයෙන් වැඩූ අය උපදින්නේ ඊළඟ බ්‍රහ්ම ලෝකය වන අප්පමාණාභ බ්‍රහ්ම ලෝකයේ.

ඉතා උත්කෘෂ්ට වශයෙන් දෙවන ධ්‍යාන සිත වඩලා තිබුණොත්

ඒ අය මීළඟ බ්‍රහ්ම ලෝකය වූ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙ යි උපදින්නේ.

(මේ බ්‍රහ්ම ලෝක තුන පිහිටා තිබෙන්නෙත් එකම තලයක.)

මේ වගේම තුන්වන ධ්‍යාන සිතත් හීන ප්‍රමාණයෙන්, මධ්‍යම ප්‍රමාණයෙන් සහ උත්කෘෂ්ට අන්දමින් දියුණු කරන්නට පුළුවන්. අල්ප වශයෙන් ඒ ධ්‍යාන සිත වැඩූ අය පරිත්තසුභ බ්‍රහ්ම ලෝකයෙත්, මධ්‍යම ප්‍රමාණයෙන් වැඩූ අය අප්පමාණසුභ බ්‍රහ්ම ලෝකයෙත්, උත්කෘෂ්ට අන්දමින් වැඩූ අය සුභකිණ්හක බ්‍රහ්ම ලෝකයෙත් උපදිනවා.

(මේ බ්‍රහ්ම ලෝක තුනත් එකම තලයක යි පිහිටා තිබෙන්නේ.)

රූපාවචර 4 වන ධ්‍යාන සිත උපදවාගත් කෙනකුට වේහප්ඵල කියන බ්‍රහ්ම ලෝකයේ උපදින්නට පුළුවන්. හතරවෙනි ධ්‍යාන සිත උපදවා ගෙන, සිතට නිග්‍රහ කරලා, සිත කෙරෙහි අතිශයින්ම කලකිරිලා, සිත නැතිව සිටිනවා නම් හොඳයි කියලා සිතාගෙන සිටින කෙනෙක් උපදින්නේ අසංඥතලයේ.

(මේ ලෝක දෙකත් එකම තලයක යි පිහිටා තිබෙන්නේ.)

ඊට ඉහළින් ඇති අවිහ - අතප්ප - සුදස්ස - සුදස්සි - අකනිට්ඨ කියන බ්‍රහ්ම ලෝක පහේ උපදින්නේ අනාගාමී වූ අය පමණ යි. අනාගාමී වීමට 4 වන ධ්‍යානයක් අවශ්‍ය යි. ඒ වගේම අනාගාමි වූ කෙනකුට හතරවෙනි ධ්‍යානයකට ඉතාමත්ම පහසුවෙන් සමවදින්නටත් පුළුවන්. එමනිසා අනාගාමි වූ කෙනකුට මරණ මොහොතේ හතරවෙනි ධ්‍යානය තමයි සිහියට එන්නේ.

අරූපාවචර ධ්‍යාන සිතුත් 4 ක් තිබෙනවා. ඒවා උපදවා ගෙන නො පිරිහිලී පවත්වා ගෙන ගිය කෙනකුට තමා උපදවාගත් ධ්‍යාන සිතට අනුව ඒ ඒ අරූපාවචර බ්‍රහ්මලෝක වල උපදින්නට පුළුවන්. පළවන - දෙවන - තෙවන - සතරවන කියන අරූපාවචර ධ්‍යාන සිත් උපදවාගත් අය පිළිවෙලින් ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතන - ආකිඤ්චඤ්ඤායතන - නේවසඤ්ඤා නාසඤ්ඤායතන කියන අරූප ලෝකවල උපදිනවා.

මේ විධියට කුශල හෝ අකුශල ගරුක කර්මයක් තිබුණොත්, එය යි මරණ මොහොතේ දී අනිවාර්යයෙන් ම සිහියට නැගෙන්නේ.

## ආසන්න කර්ම

ගරුක කර්මයක් නැත්නම්, මරණ මොහොතේ දී ඇතිවන ආසන්න කර්මයට අනුව යි ඊළඟ පුනර්භවය ගෙන දෙන්නේ. ආසන්න කර්මය කියන්නේ මරණයට ක්‍ෂණයකට පෙර අවස්ථාවේ කරන දෙයක්. කියන දෙයක් හෝ සිතන දෙයක්. 'ක්‍ෂණය'' කියා මෙහි දක්වූයේ තත්පරයෙන් ලක්ෂයකටත් වඩා අඩු කාලයක්. එසේ ඇති වූ ආසන්න කර්මයට අනුව සුගතියක හෝ දුගතියක උපදිනවා. කොපමණ කුශල් කර තිබෙන කෙනකු වුවත්, මරණ මොහොතේ ලෝභ - දෝස - මෝහ සම්ප්‍රයුක්ත සිතුවිලි සිතුවොත් දුගතියක උපදින බව අවබෝධ කර ගත යුතු යි. උදාහරණයකට එවැනි කෙනකුට මරණ මොහොතේ තමන්ගේ දූපුතුන් ආදීන් කෙරෙහි හරි, යම්කිසි දේපළක් කෙරෙහි හරි ආශාවක්, ආදරයක්, බැඳීමක් වැනි දෙයක් ඇතිවුනොත්, නැත්නම් තමන්ගේ සතුරකු සම්බන්ධයෙන් ද්වේෂ සිතක් ඇතිවුනොත් නො වරදවාම දුගතියක යි උපදින්නේ. බොහෝ අකුශල් කළ කෙනකු වුවත් මරණ මොහොතේ කුශල් සිතක් ඇතිකර ගතහොත් සුගතියක උපදිනවා. ඒ නිසා යම්කිසි කෙනකු මරණයට ආසන්න වී සිටින විට ළඟ සිටින අය ඔහුගේ හෝ ඇයගේ සිතට කුශල් සිතක් උපදවා දීමට හැකි වන සේ කටයුතු කිරීම ඉතාම සුදුසු යි. හැඬීම් - වැලපීම් වලින් වැළකී කළ යුත්තේ මරණයට පත්වන කෙනකුගේ සිත කුශල පැත්තට යොමු කිරීම යි. එසේ කිරීමෙන් මියයන තැනැත්තාට සුගතියක ඉපදීමට ඔබට උපකාර කළ හැකි යි.

## ආචීර්ණ කර්ම

ගරුක හෝ ආසන්න කර්මයක් නො මැති විට, මරණ මොහොතේ දී ආචිණ්ණ කර්මයක් සිහිපත් වන බව පොත්වල සඳහන් වෙනවා. ආචිණ්ණ කියන්නේ නිතර නිතර කරල - කරලා, පුරුදු කරල - පුරුදු කරලා තිබෙන කර්ම වලට. මෙය කුශල් හෝ අකුශල් විය හැකි යි. අද සමාජයේ බොහෝ අය නිරන්තරයෙන්ම

ලෞකික දේවල් වලම පැටලි - පැටලී, ලෝභයෙන් ද්වේෂයෙන් යුතුව යි කටයුතු කරන්නේ. ඔවුන්ගේ ආචීණි කර්ම ඒවා. ඒ නිසා මරණ මොහොතේ දීත් එවැනි ලෝභ - ද්වේෂ සිතුවිලි සිහිපත්වීමේ වැඩි ප්‍රවණතාවයක් තිබෙනවා. එයින් ඔවුන් උපදින්නේ දුගති වල යි. බුදුරජාණන් වහන්සේ නියපොත්තක් උඩට පස් ටිකක් අරගෙන පෙන්නලා, 'මෙන්න මේ නියපොත්ත උඩට ගත්තු පස් ටික වගේ ඉතා සුළු දෙනෙක් පමණ යි මනුෂ්‍ය ලෝකයෙන් මැරී ගියාට පසුව සුගතියක උපදින්නේ, මේ මහ පොළවේ පස් තරම් බොහෝ දෙනෙක් උපදින්නේ දුගතියක' යැයි කියා වදාළේ මේ නිසා.

බොහෝ දෙනකුට කුශල හෝ අකුශල ගරුක කර්ම නැහැ. ආසන්න කර්මය ගැනත් කෙනකුට රඳා පවතින්නට බැහැ. හේතුව, මොන දෙයක් කරමින් සිටින විට, මොන දෙයක් කියමින් සිටින විට, කුමක් සිතමින් සිටින විට, මරණය සිදුවේදැයි කියන්නට බැහැ. එම නිසා ආචීණි වශයෙන් නිතර නිතර කුශල කර්ම කිරීම ඉතාම සුදුසු යි.

### කටත්තා කර්ම

ගරුක-ආසන්න-ආචිණ්ණ කියන කර්ම සිහිපත් නො වුවහොත්, කටත්තා කර්මයක් මරණ මොහොතේ දී එළඹ සිටින බව යි පොත්වල දක්වෙන්නේ. කටත්තා කර්ම කියන්නේ මේ භවයේ දී හෝ පෙර භවයක දී කරන ලද කුශල හෝ අකුශල කර්මයක්. එය එක් වරක් පමණක් කළ දෙයක් හෝ වන්නට පුළුවන්. ඒ කටත්තා කර්මයට අනුව නැවත ඉපදීම ගෙන දෙනවා සුගතියක හෝ දුගතියක.

### කර්ම - කර්ම නිමිති - ගති නිමිති

මරණයට පත්වන විට කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් පෙනෙන බවත් පොත්වල සඳහන් වෙනවා.

මරණ මොහොතේ කලින් කී කර්ම නියාමයට අනුව කර්මයක්ම සිහිපත් වන්නට පුළුවන්. එහෙමත් නැත්නම්, කර්මයක් කිරීමට උපකාරී වූ දේවල් කර්ම නිමිත්තක් වශයෙන් පෙනෙන්නට පුළුවන්.

උදාහරණ වශයෙන් අපි ගනිමු බුද්ධ පූජාමය කුශලයක්. ඒ කුශල කර්මය කිරීමට පාදක වූ බුද්ධ ප්‍රතිමාවක් හෝ, ඒ බුද්ධ පූජාවට ගත් මල් පහන් ආදී වස්තූන් හෝ, බුද්ධ පූජාවට සහභාගී වී සිටි තමන් ඇතුළු වෙනත් අය හෝ කර්ම නිමිත්තක් වශයෙන් දර්ශනය වන්නට පුළුවන්.

සමහර අයට තමන් මැරී ගොස් උපදින ස්ථානය නිමිත්තක් වශයෙන් පෙනෙන අවස්ථාත් තිබෙනවා. අපායේ උපදින්නට යන අය 'මට ගින්දර පෙනෙනවා, ගිනිදැල් පෙනෙනවා' ආදී දේ කියන අවස්ථා අපට අසන්නට ලැබෙනවා.

සමහරවිට මියගිය ඥාතීන් අමනුෂ්‍ය ආත්ම භාවයන් ලබා සිටිනවා නම්, ඒ අය ඇවිත් විවිධ නිමිති පෙන්නලා ඒ අයගේ ලෝකයට මරණයට පත්වන අය ඇදගෙන යන්නට උත්සාහ කරන අවස්ථාත් තිබෙනවා. ''ඔය ඉන්නේ මගේ අම්මා ඇඳ ළඟම'' ආදී දේ මැරෙන්නට යන අය කියන අවස්ථා සමහරවිට මේ අය අසා ඇති. එහෙම අවස්ථාවල දී ළඟ සිටින අය මැරෙන කෙනාගේ සිත කුශල පැත්තට නැඹුරු කිරීමට උත්සාහ ගත යුතු යි.

මේ විධියට ගරුක - ආසන්න - ආචිණ්ණ -කටත්තා කියන කර්මයක් ම සිහිපත් වුනාත්, එහෙම නැත්නම් කර්ම නිමිත්තක් සිහිපත් වුවත්, එහෙමත් නැත්නම් ගති නිමිත්තක් පෙනී ගියත්, ඒ සෑම අවස්ථාවක දී ම එය මරණ මොහොතේ ඇතිවූ ආසන්න කර්මයක් වනවා. එම නිසා නැවත ඉපදීම ගෙන දෙන්නේ ආසන්න කර්මයෙන් කියා කියන්නට පුළුවන්.

### ආසන්න කර්මයේ අරමුණු

ඒ ආසන්න කර්මයට අරමුණු වන්නේ කර්මයම හෝ කර්ම නිමිති හෝ ගති නිමිති කියලා කීවාට, සත්‍ය වශයෙන්, පරමාර්ථ වශයෙන් අරමුණු වන්නේ ඒවා නො වෙයි; තමන්ගේ ම පංචස්කන්ධ ධර්ම.

කුශල හෝ අකුශල කර්මයක් කරන අවස්ථාවේ දීත් ඇතිවන්නේ පංචස්කන්ධ කර්ම. ඒක නිසා එවිට රැස් වන්නේත් පංචස්කන්ධ ධර්ම. අපි උදාහරණ වශයෙන් ගනිමු බෝධි පූජාමය කුශල කර්මයක්.

බෝධිය, බෝධි පූජාමය වස්තූන් ආදිය දකින විට චක්ඛු විඥාන පහළවන්නේ. ඒ කුශලය කිරීමේ දී ගාථා සජ්ඣායනා කිරීම් ආදිය ඇසෙන විට සෝත විඥාන පහළවනවා. සුවඳ දුම් ආදිය ආඝ්‍රාණය වන විට ඝාන විඥාන ඇතිවන අතර, ඒ පූජා වස්තූන් ආදිය කයින් ස්පර්ශ කරන විට කාය විඥානත්, ඒ පුණ්‍ය කර්මය හා සම්බන්ධව සිතුවිලි පහළවන විට මනෝ විඥානත් ජනිත වනවා. මේ විධියට කර්මයක් කරන විට විඥානස්කන්ධය ඇතිවෙමින් නැතිවෙමින් යනවා.

ඒ කුශල කර්මය හා සම්බන්ධ දේවල් හඳුනා ගන්නා විට සංඥාස්කන්ධයත්, ඒ කුශල කර්මය සිදු කිරීමේ දී සැප - දුක් - මැදහත් ආදී වේදනා ඇතිවන විට වේදනාස්කන්ධයත්, ඒ හා සම්බන්ධ ශ්‍රද්ධාව, භක්තිය, ගෞරවය, ප්‍රඥාව, චේතනාව ආදී චෛතසික ධර්ම පහළවන විට සංස්කාරස්කන්ධයත් ඇතිවෙවී නැතිවෙවී යන අතර, මෙවිට ශරීරයේ චිත්තජ රූප පහළවන විට රූපස්කන්ධයත් ඇතිවෙමින් නැතිවෙමින් යනවා. මේ විධියට පංචස්කන්ධ ධර්මයනු යි රැස් වන්නේ. අකුශල කර්මයක් කළත් සිදුවන ක්‍රියාදාමය මේකම යි. කුශල් හෝ අකුශල් රැස්වීමක් තිබුණට, පරමාර්ථ වශයෙන් සිදුවන්නේ පංචස්කන්ධ ධර්ම රැස්වීමක්. කුශලයක් කළත්, අකුශලයක් කළත් පංචස්කන්ධ ධර්ම ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යාමක් හැර අන් කිසිවක් සිදුවන්නේ නැහැ කියන කරුණ ඉතා පැහැදිලිවම අවබෝධ කර ගත යුතු යි. මෙම නිසා බුදුරජාණන් වහන්සේ වදාරනවා,

**''රූපං රූපත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**
**වේදනං වේදනත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**
**සඤ්ඤං සඤ්ඤත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**
**සඞ්ඛාරේ සඞ්ඛාරත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති**
**විඤ්ඤාණං විඤ්ඤාණත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති"**

කියලා.

රූපය උපාදාන කරගෙන, ''මම, මගේ'' කියලා හිතා ගෙන, රූපය කෙරෙහි තණ්හා-දිට්ඨි-මාන ආදී කරුණු වලින් යුතුව, රූපය ලැබෙන දේවල්ම යි මේ රැස් කරන්නේ.

වේදනාව උපාදාන කරගෙන, වේදනාව මමය මගේය කියලා හිතාගෙන, වේදනාවට ඇලිල බැඳිලා කුශලාකුශල කර්ම රැස්කරන විට, වේදනා ගෙන දෙන දේවලු යි මෙලෙසින් රැස්කරන්නේ.

සංඥා - සංස්කාර - විඥාන කියන සෙසු ස්කන්ධත් ඒ ආකාරයෙන් උපාදාන කරගෙන, ග්‍රාහණය කරගෙන, කුශලාකුශල කර්ම රැස්කරන විට, රැස්කරන්නේ සංඥා, සංස්කාර, විඥාන කියන ඒ ඒ ස්කන්ධ ධර්මයන් උපදවා ගැනීමට හේතුවන දේවල්.

මේ නාමස්කන්ධ ක්‍රියාත්මක වන විට, රූපස්කන්ධයත් ක්‍රියාත්මක වන නිසා රූපස්කන්ධයක් මෙහි දී මේ රැස්වන්නේ.

එතකොට රැස්කළේ පංචස්කන්ධ ධර්මයන් උපදවා ගැනීමට හේතු වූ දේවල්. ඒවා රැස්කළා නම්, අනිවාර්යයෙන්ම පංචස්කන්ධ ධර්මයන්ම ලැබෙන්නට ඕනෑ.

මරණ මොහොතේ කර්ම - කර්ම නිමිති - ගති නිමිති සිහිපත් වන විට සිදු වන්නෙත් පංචස්කන්ධ ධර්ම ඇතිවෙමින් නැතිවෙමින් යාමක්. අපි හිතමු කර්මයක් වශයෙන් බුද්ධ පූජාමය කුශල කර්මයක් සිහිපත් වුනා කියලා. ඒ සිහිපත් වන විට මනසට එය අරමුණු වනවා. එවිට විඥානස්කන්ධය ඇතිවනවා. මේ මේ විධියට මල් පහන් පූජා කළා කියලා ආදී වශයෙන් සංඥා ජනිත වනවා. කුශල කර්මය සිහිපත් කරන විට නිරාමිස සතුටකින් එය කළා නම්, ඒ සතුට ආදී වේදනාවන් දූත් සිහිපත් වන විට වේදනාස්කන්ධය පහළවනවා. ඒ කුශලය කරන විට ඇති වූ ශ්‍රද්ධාව ආදී චිත්ත සංස්කාර ධර්ම අරමුණු වන විට සංස්කාරස්කන්ධයත් ඇතිවනවා. මෙලෙසින් සිහිපත් කරන විට, රූපස්කන්ධයත් ක්‍රියාත්මකවනවා.

එතකොට මරණ මොහොතේ සිහිපත් වූ මේ කර්මයට අරමුණු වන්නෙත් පංචස්කන්ධ ධර්ම; රැස්වන්නේත් පංචස්කන්ධ ධර්ම. පංචස්කන්ධ ධර්ම රැස්වන දෙයක් මේ පුද්ගලයා මේ මැරෙන මොහොතේ සිදු කරන්නේ. එහෙම කළා නම්, නැවත නැවත උපදින කොට එහි විපාකයක් වශයෙන් පංචස්කන්ධ ධර්ම ම පහළවන්නට ඕනෑ. එම නිසා පංචවෝකාර භවයක යි ඔහු උපදින්නේ. මරණ මොහොතේ සිහි කළ කුශල් අකුශල් කර්මයට අනුව ස්කන්ධ පහම තිබෙන සුගති හෝ දුගති ලෝකයක ඔහු උපදිනවා.

කර්ම නිමිත්තක් සිහිපත් වුණත්, ගති නිමිත්තක් සිහිපත් වුණත්, ඒ සෑම විටම පංචස්කන්ධ ධර්ම ම අරමුණු වන බව මේ අනුසාරයෙන් මේ අය අවබෝධ කර ගත යුතු යි.

අපි හිතමු අරූපාවචර ධ්‍යාන කුශල් සිත් උපදවා ගෙන සිටි කෙනකුට එය මරණ මොහොතේ සිහිපත් වුනා ගරුක කර්මයක් වශයෙන් කියලා. අරූපාවචර ධ්‍යාන සිත් උපදවා ගත් විට රූපය සිතට පෙනෙන්නේ නැහැ; රූපය සිතට අරමුණු වන්නේ නැහැ. රූපය අතහැරිල යි තිබෙන්නේ. එම නිසා මරණ මොහොතේ අරූපාවචර ධ්‍යාන සිතක් සිහිපත් වන විට, අරමුණු වන්නේ වේදනා - සංඥා - සංස්කාර - විඥාන කියන ස්කන්ධ ධර්ම 4 පමණ යි. එම නිසා එවැනි කෙනකුව රූපයක් තිබෙන ලෝකයක උපදින්නට බැහැ. අරූපාවචර ලෝකයක, ඒ කියන්නේ චතුවෝකාර භවයක ඔහු උපදින්නට ඕනෑ.

හතරවෙනි රූපාවචර ධ්‍යානය උපදවා ගත් කෙනකු සිත ගැන අන්තිමටම කලකිරිලා, සිත එපාවෙලා, සිත නිසා තමයි මේ ඔක්කොම දුක් විඳින්නට සිදු වන්නේ, සිත නැත්නම් මේ මොන දුකක්වත් නැහැ, මේ සිත එපා එපා එපා ''ධී චිත්තං, ධී චිත්තං'' කියලා සිතට නිග්‍රහ කරලා, පරිභව කරලා, මේ සිත කෙරෙහි පුදුම කලකිරීමකින් යුතුව කටයුතු කරලා, එය මරණ මොහොතේ ඔහුට සිහිපත් වුනා කියලා අපි හිතමු. ඒ පුද්ගලයා සිත ගැන සම්පූර්ණයෙන් ම කලකිරිලා සිටින නිසා, මරණ මොහොතේ ඒ සිත සිහිපත් වුනත්, ඒ සිහිපත් වන සිත කෙරෙහිත් කලකිරී එයත් ඔහු අතහරිනවා. රූපය කෙරෙහි පමණක් ඔහුගේ සිතේ ඇලීමක් තිබෙන නිසා ඔහු උපදින්නේ සිත නැති රූපය පමණක් තිබෙන ඒකවෝකාර භවයක් වූ අසංඥතලයේ.

මේ විධියට මරණ මොහොතේ බැඳීමක් තිබෙන්නේ ස්කන්ධ ධර්ම 5 ම කෙරෙහි හරි, ස්කන්ධ ධර්ම 4 ක් කෙරෙහි හරි, එක් ස්කන්ධයක් කෙරෙහි හරි වන්නට පුළුවන්. ඒකට අනුකූල වන ආකාරයෙන් තමයි නැවත නැවත උපදින්නේ. මේ විධියට පුනර්භවය සිදු වනවා.

### කර්ම විඥානය

මරණ මොහොතේ කර්මයක් හරි, කර්ම නිමිත්තක් හරි, ගති නිමිත්තක් හරි පෙනී, පංචස්කන්ධ ධර්ම අතුරෙන් කවරක් හෝ අරමුණු වෙමින් පවත්නා විඥානයට කියන්නේ කර්ම විඥානය කියලා. ස්කන්ධ ධර්ම අරමුණු නො කර මෙම කර්ම විඥානය ඇති නො වන බව බුදුරජාණන් වහන්සේ විසින් මෙලෙසින් වදාරා තිබෙනවා.

''උපයෝ භික්ඛවේ අවිමුත්තෝ, අනුපයෝ විමුත්තෝ''.

**උපයෝ භික්ඛවේ අවිමුත්තෝ** - උපයෙන් යුතු අය සසරින් මිදිලා නැහැ. උපය කියන්නේ තණ්හා, දිට්ඨි, මාන, අවිද්‍යා ආදී දේවල් වලට. උපයෙන් යුතු අය ළඟ භවයේ රැඳී සිටීමේ භව ආශාව ඇතුළු තණ්හාව තිබෙනවා; ''මම'' කියලා කෙනෙක් සිටිනවා කියන මානයත්, එම දිට්ඨියත් තිබෙනවා; චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ නො කළ අවිද්‍යාවත් තිබෙනවා. මේවායින් යුතු අය සංසාරයෙන් නිදහස් වෙලා නැහැ. නැවත නැවත ඉපදෙනවා.

**අනුපයෝ විමුත්තෝ** - තණ්හා දිට්ඨි මාන අවිද්‍යා ආදී උපය අත්හළ අය සංසාරයෙන් මිදිලා; නැවත උපදින්නේ නැහැ; ජාතිය ක්ෂය කරලයි ඒ අය සිටින්නේ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාරනවා,

**''රූපූපයං වා භික්ඛවේ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, රූපාරම්මණං රූපප්පතිට්ඨං නන්දූපසේවනං වුද්ධිං විරූළ්හං වේපුල්ලං ආපජ්ජෙය්‍ය.**

**වේදනූපයං වා භික්ඛවේ, විඤ්ඤාණං - පෙ - ආපජ්ජෙය්‍ය.**

**සඤ්ඤූපයං වා භික්ඛවේ, විඤ්ඤාණං - පෙ - ආපජ්ජෙය්‍ය.**

**සඞ්ඛාරූපයං වා භික්ඛවේ, විඤ්ඤාණං - පෙ - ආපජ්ජෙය්‍ය.**

රූපය උපාදාන කරගෙන සිටින අය තමන්ගේ රූපයත්, බාහිර අජීවී සජීවී රූපත්, රූප භව වශයෙන් දක්වෙන රූපාවචර බ්‍රහ්ම ලෝක 16 ත් උපාදාන කරගෙන යි සිටින්නේ. **රූපූපයං වා භික්ඛවේ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, රූපාරම්මණං රූපප්පතිට්ඨං** - මෙලෙසින් රූපය උපාදාන කරගෙන සිටින අයගේ මරණ මොහොතේ එළඹ සිටින කර්ම විඥානය රූපය අරමුණු

දකිනවා නම්, ඒක ඔහුගේ සිත තුළ තිබෙන සම්මා දිට්ඨියක්. මෙය හරියට ම දකින්නට පුළුවන් වන්නේ භාවනාවෙන් ඉහළ දියුණුවක් ලබලා ඇති කෙනකුට පමණ යි. විශේෂයෙන් ම නැවත ඉපදීම සිදු වන්නේ මෙහෙම යි කියලා ප්‍රායෝගිකව අත්දකින්නට, ඒ ගැන පැහැදිලි අවබෝධයක් ඇතිකර ගැනීමට හැකි වන්නේ ජාතිය ක්ෂය වී යන ආකාරය දකින්නට හැකි රහත් වූ කෙනකුට පමණ යි.

**භව සමුදයා, ජාති සමුදයෝ** - භවය නිසා ජාතිය ඇතිවෙනවා කියන කරුණ ගැන මේ දක්වා ප්‍රකාශ කළේ න්‍යායාත්මක කරුණු ටිකක් පමණ යි. මේකේ ප්‍රායෝගික පැත්ත ගැන, මේ අයට තේරුම් ගත හැකි කරුණු පමණක් **භව නිරෝධා, ජාති නිරෝධෝ** - කියන කොටස විස්තර කරන විට කියන්නම්. ජාතිය - ජාති සමුදය - ජාති නිරෝධය - ජාති නිරෝධ ගාමිණී පටිපදාව දැකීම තුළින් කාමරාග - පටිඝ - දිට්ඨි - මාන අනුශය ආදී අනුශය ධර්මයන් නසලා, අවිද්‍යාව ප්‍රහීණ කොට දුක කෙළවර කළ හැක්කේ කෙසේද කියන කරුණ අවබෝධ කර ගත හැක්කේ ඒ ප්‍රායෝගික පැත්ත අත්දැක්කොත් පමණ යි. න්‍යායාත්මක කරුණු දැන ගැනීමෙන් ඒක සිදුවන්නේ නැහැ.

ජාතිය - ජාති සමුදය - ජාති නිරෝධය - ජාති නිරෝධ ගාමිණී පටිපදාව දැකීමෙන් සෝවාන් ආදී මාර්ග ඵල ලබන්නට පුළුවන් වන්නේ කොහොමද කියා මේ අය නුවණින් කල්පනා කර බලන්න. එහෙම බලනකොට තමන්ටම ඒක හරිට අවබෝධ වී පෙනී යනවා නම්, ඒ පැත්තට ම මනසිකාර පවත්වාගන යමින් තව තවත් ගැඹුරින් ගැඹුරට සිත යවන්න. එලෙසින් ගැඹුරින් අවබෝධ වෙවී යනවිට නාම රූප නිරෝධය අත්දකිමින් නිවන පවා අත්දකින්නට සමහරවිට හැකි වේවි.

## සාරාංශය

එතකොට මේ දක්වා ප්‍රකාශ කළ කරුණුවල සාරාංශය මේකයි. අප පළමුවෙන්ම පෙන්නුම් කළේ ජරා මරණ - ජරා මරණ සමුදය - ජරා මරණ නිරෝධය - ජරා මරණ නිරෝධ ගාමිණී පටිපදාව දැකීම තුළින් කෙසේනම් කෙනකුට නිවන් ලබන්නට පුළුවන් ද කියන කරුණ යි. ඒ පිළිබඳව ප්‍රායෝගික විස්තරයක් ඉදිරිපත් කළා නො වෙයි, මේ විධියට කටයුතු කිරීමෙන් මේ විධියට නිවන් අවබෝධ කළ හැකි යි කියන කරුණ පමණ යි පෙන්නුම් කළේ. ඒවා විස්තර කරනවා නම්, ඒ සෑම ක්‍රමයක් තුළින්ම සෝවාන් ආදී සියලුම මාර්ග ඵල ලැබෙන ආකාරය පිළිබඳ අති දීර්ඝ විස්තරයක් කරන්නට සිදු වනවා.

ඊළඟට ප්‍රකාශ කළේ ජාතිය - ජාති සමුදය - ජාති නිරෝධය - ජාති නිරෝධ ගාමිණී පටිපදාව කියන කරුණු හරියට අවබෝධ කරගත්තා නම්, එතෙකින්ම කෙනකුගේ සිත තුළ සම්මා දිට්ඨිය පිහිටනවා; එතෙකින්ම රහත්භාවය හෝ වෙනත් මාර්ග ඵලයක් ලබලා, ධර්මය පිළිබඳ නො සැලෙන ශ්‍රද්ධාවක් ඇති පුද්ගලයෙක් බවට පත්වෙලා සම්මා දිට්ඨිය ඍජු කර ගන්නට ඔහුට පුළුවන් වෙනවා කියන කරුණ යි.

ජාතිය කියන්නේ මොකක් ද? යම් තැනකින් මැරුණට පස්සේ, අණ්ඩජ ජලාබුජ සංසේදජ ඕපපාතික වශයෙන් පුනර්භවය ගෙන දෙනවා නම් ඒකට යි ජාතිය කියන්නේ.

ජාති සමුදය කියන්නේ කුමක්ද? භව සමුදයා, ජාති සමුදයෝ - භවය නිසයි ජාතිය ඇතිවන්නේ. උප්පත්ති භව - කර්ම භව කියලා භවයේ කොටස් දෙකක් තිබෙනවා. උප්පත්ති භව කියන්නේ සත්ත්වයන් උපදින ලෝකවලට.

1. කාම භව, රූප භව, අරූප භව
2. ඒක වොකාර භව, චතුවෝකාර භව, පංච වෝකාර භව
3. සඤ්ඤී භව, අසඤ්ඤී භව, නේවසඤ්ඤීනාසඤ්ඤී භව කියලා උප්පත්ති භව කොටස් තුනකට බෙදා දක්වා තිබෙනවා.

කර්ම භව කියන්නේ කුශල අකුශල කර්ම වලට. මරණ මොහොතේ කර්ම ඉදිරිපත් වන නියාමයක් තිබෙනවා. ගරුක - ආසන්න - ආචිණ්ණ

- කටත්තා කියන අනුපිළිවෙළ යි ඒ කර්ම නියාම ය.

මරණ මොහොතේ කර්මයක් හෝ, කර්ම නිමිත්තක් හෝ, ගති නිමිත්තක් එළඹ සිටින්නට පුළුවන්. මේ කවරක් සිහිපත් වුනත්, මරණ මොහොතේ දී එය ආසන්න කර්මයක් වන නිසා, නැවත ඉපදීම සිදු වන්නේ ආසන්න කර්මයෙන්. (මෙය මගේ අදහසක් පමණ යි.)

මරණ මොහොතේ දී නැවත ඉපදීම ගෙන දෙන කර්ම ශක්තියට යි කර්ම විඥානය කියන්නේ. ඒ කර්ම විඥානයට අරමුණු වන්නේ පංචස්කන්ධ ධර්ම; නැත්නම් ස්කන්ධ 4 ක්. කර්ම රැස්කරන විටත් පංචස්කන්ධ හෝ ස්කන්ධ 4 ක් රැස්කරන නිසයි එසේ වන්නේ. ඒ ස්කන්ධ ධර්ම උපාදාන කරගෙන සිටින ආකාරයට අනුව භවයක නැවත උපදිනවා.

යම්කිසි කෙනෙක් පංචස්කන්ධ ධර්ම උපාදාන කරගෙන සිටිනවා නම්, කර්ම විඥානයට එළඹ සිටීමට එතන තිබෙනවා ප්‍රතිෂ්ඨාවක්, පංචස්කන්ධ ධර්ම කෙරෙහි පවත්නා උපාදාන නිරුද්ධ කරලා තිබෙනවා නම්, කර්ම විඥානයට පිහිටා සිටින්නට ප්‍රතිෂ්ඨාවක් නැහැ; එවිට ජාතිය ක්ෂය වනවා.

හොඳයි, ඒ ආකාරයෙන් පිළිපැදීම තුළින් මේ අයටත් නිවන් සුව ලබා ගැනීමට හැකි වේවා යි ආශිංසනය කරමින් මේ දේශනාව නිම කරනවා.

ඔබ සැමට නිවන් සුව ම අත්වේවා!